# අසහනය සහ කනස්සල්ල සඳහා ඉස්ලාමීය ප්‍රතිකාරය

[ Sinhala – سنهالي ]

ෂෙය්ඛ්: සාලිහ් අල් මුනජ්ජිද්

පරිවර්තක

ජාසිම් ඉබ්න් දඉයාන්

2013 - 1434

IslamHouse.com

# علاج الهموم

« باللغة السنهالية »

محمد صالح المنجد

ترجمة: جاسم دعيان

2013 - 1434

IslamHouse.com

# අසහනය සහ කනස්සල්ල

# සඳහා

# ඉස්ලාමීය ප්‍රතිකාරය

කර්තෘ

අෂ් ෂෙය්ක්

මුහම්මද් සාලිහ් අල් මුනජ්ජිද්

සිංහල පරිවර්තක

ජාසිම් බින් දඉයාන්

# පටුන


1. විවිධ වර්ගයට අයත් ආතතිය සහ කනස්සලු

2. නැමදුම් පිළිබඳව සන්වේගය

3. අසත්‍ය චෝදනාවට ලක් වූ සත්‍යවාදියෙකුගේ අසහනය

4. අසත්‍ය චෝදනාවට ලක් වූ අහිංසකයෙකුගේ අසහනය

5. අසත්‍ය චෝදනාවට ලක් වූ අවංක කාන්තාවකගේ කථාව

6. තම මරණයෙන් පසු පවුලේ අය ගැන කනස්සල්ල

7. ණය වීම පිළිබව හට ගන්නා අසහනය

8. සිහින දිටීමෙන් හට ගන්නා අසහනය

9. බිහිසුණු සිහින දකින කෙනෙකුට ඉස්ලාම් හි විවිධ ප්‍රතිකාරය

10. අසහන සහ කනස්සලු සඳහා ඉස්ලාමයේ ඇතැම් ප්‍රතිකාර

අ. ස්ථිර ඊමානය සහිතව යහපත් ක්‍රියාවන් හී නිරතවීම

ආ. පාපයන්ට ක්ෂමාව අයදින්නේ කෙසේදැයි සෙවීම

ඇ. මෙලොවේ යථාර්ථය පහදා ගැනීම

ඈ. නබි (සල්) තුමාණන්ගේ ආදර්ශය අනුගමනය කිරීම

ඉ. මරණයෙන් පසු ජීවිතය තම ඉලක්කය කර ගැනීම

11. මරණය සිහිපත් කිරීම - විස්මිත ඵලදායි ප්‍රතිකාරයකි
12. අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කිරීම
13. නබි (සල්) තුමාණන්ට සලවාත් කීම
14. අල්ලාහ් වෙත සියලු කරුණු භාර කිරීම
15. පීඩා හා සිත් තැවිල්ලෙන් මිදීමේ තවත් මාර්ග කිහිපයක්
16. අල්ලාහ් නිතරමෙන් සිහි කිරීම
17. නැමදුමෙහි සරණ පැතීම
18. ජිහාද් - සිත් තැවිල්ල ඉවත් කිරීමේ තවත් මාර්ගයකි
19. අල්ලාහ්ගේ ප්‍රකට හා ගුප්ත ආශීර්වාද ගැන කථා කිරීම
20. දැනුම සෙවීම වැනි ප්‍රයෝජනවත් ක්‍රියාවෙහි නිරතවීම
21. අප්‍රිය කරන දැය වෙත ධනාත්මකව බැලීම
22. මෙම කෙටි ජීවිතයේ සැබෑ වටිනාකම පහදා ගැනීම
23. වැඩ කොටස ගොඩ ගැසීමට ඉඩ නොතැබීම
24. ඕනෑම දැයකට සූදානම් ව සිටීම
25. ආගමික විද්වතුන් ගෙන් උපදෙස් පැතීම
26. ඥාණවත් හා යහපත් අය සමඟ කථා කිරීම
27. සෑම ව්‍යසනයෙන් පසුව පහසුව ඇත
28. ආහාර මඟින් අසහනයට ප්‍රතිකාර
29. ඉමාම් ඉබ්න් අල් කය්යිම්ගෙන් උපදෙස්
30. අල්ලාහ්ගෙන් පමණක් සහාය පැතීම
31. දුආ - ප්‍රාර්ථනා

# ප්‍රකාශකගෙන් පණිවුඩයක්

මෙම ලෞකික ජීවිතයේ නොයෙක් කනස්සල්ලට හා ආපදාවන්ට මිනිසුන් ලක් වීම ස්වාභාවික දෙයකි. මෙලොව තාවකාලින එකක් වන අතර, බලවත් හිරිහැර හා පීඩාව පිරුණු එකකි. මරණයෙන් මතු ජීවිතය සම්පූර්ණ සතුට සහිත ස්ථානයක් වන අතර එහිදී කනස්සලු හෝ නොසන්සුන්කම් හටගන්නට කිසිදු හේතුවක් නැත.

මිනිසුන් මෙලොවෙහි තම තමන්ගේ ප්‍රශ්න හා කනස්සලු සහිතව සිටීම ස්වාභාවික දෙයකි. එහෙත් කනස්සල්ල සහ ආතතිය පිළිබඳ ක්‍රියා කරන්නේ කෙසේ දැයි දැන ගැනිම ඉතා වැදගත්ය. විශ්වාස වන්තයෙක් මේවාට ශුද්ධ වූ කුර්ආනයේ සහ රසූල් (සල්) තුමාණන්ගේ සුන්නාහ් (මඟ පෙන්වීම) තුළින් විසඳුම් සොයයි.  මෙම පොත් පිංචයේ කර්තෘ මිනිසාගේ කනස්සලු වර්ගී කර, ඒවාට අල් කුර්ආනය සහ  සුන්නාහ්ව පෙන්වන ප්‍රතිකාර කුමක් දැයි දන්වා ඇත. මෙහිදි සත්‍ය කථාවන්ද ඇතුලත්ව තිබෙන අතර, ඒවා මගින් පාඨකයා මෙවන් ප්‍රශ්නයන්ට මුහුණ දෙනවිට ක්‍රියා කළ යුත්තේ කෙසේදැයි අසහනයට පත්වූ කෙනෙකුට උගන්වයි. ලෞකික දේවල් ගැන අධික ලෙස කල්පනා කිරීම සහ මරණයෙන් මතු ජීවිතය ගැන අමතක කිරීම මේ සියලු ආතතිය හා කනස්සල්ලට ප්‍රධාන හේතුවේ.

මුස්ලිම්වරුන් මෙහිදී මුහුණ දෙන ප්‍රශ්න හා කනස්සලු සඳහා සහනයක් දෙන ලෙස අති උතුම් අල්ලාහ්ගෙන් දුආ කරමි. අල්ලාහ්ගේ සාමය හා ශාන්තිය මුහම්මද් (සල්) තුමාණන්ටත් එතුමාණන්ගේ පවුලේ අයටත් හිත මිතුරන්ටත් අවසානය දිනය දක්වා එතුමාණන්ව අනුගමනය කරන අයටත් හිමිවේවා. ආමීන්.

මුහම්මද් මුහ්සින් අල් තුවෙයිජිරි,
ජාත්‍යන්තර ඉස්ලාමිය පොත් ප්‍රකාශන ශාලාව (IIPH)
රියාද් , සවුදි අරාබියා

# හඳුන්වා දීම

සියලු පැසසුම් සර්ව බලධාරි හා පරමාධිපති අල්ලාහ්ට හිමිවේවා. ශාන්තිය හා සාමය මුහම්මද් (සල්) තුමාණන්ට, ඒතුමාණන්ගේ පවුලේ සාමාජිකයන්ට, සහාබාවරුන්ට හා අනුගාමියන්ට හිමිවේවා.

මෙම ලෞකික ජීවිතයෙහි දුක්, කනස්සලු වැනි උවදුරු වලට මිනිස්සු භාජන වීම ස්වාභාවිකය. එයට හේතුව මෙම ලොව අසනීප, අසීරුතාව හා අසහන පිරුණු ස්ථානයක වීමය්. ස්වර්ගය හා මෙලොව සසඳා බලන විට ස්වර්ගය යනු දුක් හෝ කනස්සලු නොමැති ස්ථානයක් වීමයි.

*"එහි ඔවුනට ආයාසයක්ද නැත. ඔවුහු එයින් බැහැර කරනු ලබන්නේද නොවෙති."* අල් කුර්කුර්ආන් වාක්‍ය 15: 48.

ස්වර්ගයේ ජනතාවට වචනයකින් වූවද කිසිදු දුකට පත්වීමට කිසිදු හේතුවක් නොමැත.

*"ඔවුහු එහි අල්ලාප සල්ලාප හෝ ප්‍රතිදෝෂාරෝපන හෝ නොඇසෙති. සාමය, සාමය, කිය මිස නැත."* අල් කුර්ආන් 56: 25, 26.

මෙලොවෙහි නොයෙක් හේතුන් මත දුක් විඳින්නට හා නොයෙක් කරදර වලට මුහුණ දීමට ජනතාවට සිදුවන බව අල්

කුර්ආන් වාක්‍ය 90: 4 මෙසේ පවසයි. *“සැබැවින්ම, අපි පීඩිතකමේ මරගාත කරන්නට මිනිසා නිර්මාණය කළෙමු.“*

එබැවින්, අතීතයේ සිදු වූ දේ සඳහා පසුතැවිල්ලටද, අනාගතයේ දී සිදු වීමට තිබෙන දේ ගැන සිතා අසහනයටද වර්තමානයේ සිදු වන දේ ගැන දුක් කනස්සල්ලටද මිනිසුන් භාජන වනු අපි දකිමු.

අතීතයේදී දුක් ගෙන දුන් සිද්ධියක් හෝ අනාගතයේ සිදු විය හැකි බව අපි බියවන සිද්ධියක් හෝ වර්තමානයේ කනස්සල්ලට ලක් වෙමින් සිටින දෙයක් අප සිත් තුළ ව්‍යසනයක් ඇති කරයි.

ආතතියට හෝ කනස්සල්ලට ලක් වන ජනතාව, ඒවා තමන්ට අදාළ වන ප්‍රමාණයට විවිධාකාර ප්‍රතිචාර දක්වති. ඒවා දීර්ඝ කාලීන හෝ තාවකාලීන කරදරය හෝ වේවා, ඔවුන්ගේ සිත් තුළ දේව විශ්වාසය තිබේද, නැතහොත් හිතුවක්කාර හා පාපිෂ්ටයන්ද යන පසුබිම එයට අදාළ වන්නේය. මිනිසුන්ගේ හදවත් වර්ග දෙකකට අයත්ය. අල්ලාහ් හා සම්බන්ධවීමේ හේතුවෙන්, ආලෝකය, ජීවමාන, සතුට, සහ සියලු යහපත් ගුණාංගයන්ගෙන් පිරී තිබෙන හදවත, නැතහොත් ෂෛතාන් හා සම්බන්ධ වීමෙන්, අන්ධකාරය, කනස්සලු, මරණය, ශෝකය, හා අසහනය යන හැඟීම් වලින් පිරුණු හදවතක් යන වර්ග දෙකකි.

මිනිසුන්ගේ අරමුණ, අවස්ථාවන් සහ පෞද්ගලික වගකීම් වලට සාපේක්ෂිකව ඔවුන්ගේ අසහනය සහ ඒවාට ඔවුන් දක්වන වැදගත්කම වෙනස්වූ තත්ත්වයේ පවතිනු ඇත.

ඇතැම් වර්ගයේ කනස්සලු අගනා බව සැලකේ. එනම් මුස්ලිම් සමාජ යේ පැන නගින බලවත් හා සංකීර්ණ ගැටුමු

සඳහාද ඒවාට සුදුසු පියවර සෙවීම පිණිසද විද්වතුන් ගේ සිත් තුළ නැගෙන කනස්සලු එහි නිදසුනකි.

තවත් නිදසුනක් වන්නේ, මුස්ලිම් නායකයෙක් තම වගකීම යටතේ ජීවත් වන පුරවැසියන් පිළිබඳව සිත් කනස්සල්ලට ලක්වීම. උමර් ඉබ්න් අල් කත්තාබ්(රලි) සහ උමර් ඉබ්න් අබ්දුල් අසීස්(රලි) සහ තවත් මුස්ලිම් නායකයින් තම ජනතා පිළිබඳව සිත් තැවිල්ලට ලක් ව සිටියහ. උමර් ඉබ්න් අල් කත්තාබ් (රලි) සතුරු උවදුරෙන් ජනතාව ආරක්ෂා කරන අරමුණින් සලාහ් ඉටු කරන අවස්ථාවන් හි පවා තම සේනාව සූදානම් කරන්නේ කෙසේ දැයි කල්පනා කළේය. එපමණක් නොව, තම පාලනය යටතේ සැතපුම් දහස් ගණනාවක් දුර තිබෙන ඉරාක් රටේ, කකුල පැටලී බිම වැටිය හැකි එළුවා ගැන සලාහ් කරන අවස්ථාවෙහි කල්පනා කළ අතර, මේවී සියල්ල සඳහා අල්ලාහ් ඔහුට සමාව දුන්නේය.

තමා පසුවන අපහසු තත්ත්වය ගැන උමර් ඉබ්න් ඉබ්දුල් අසීස් (රලි) මෙසේ පවසීය. “අල්ලාහ් හැර අන් කිසිවෙකුට සහාය දිය නොහැකි විෂයක් පිළිබඳව මම කටයුතු කරමි. මහලු අය එම තත්ත්වය සමග තම ජීවිතයේ අවසානය දක්වා ගොස් ඇත. තරුණයෝ එය සමග හැදී වැඩී ඇත. පරදේශින් අරාබි බස ඉගෙන ගෙන සිටින අතර, ගම්බද අරාබිවරු මෙම තත්ත්වය මැද නගර වාසයට ගොස් සිටිති. මෙම තත්ත්වයේ ඔවුනොවුන් සම්පූර්ණයෙන් ගිලිහී, මෙයයි දහම යනුවෙන් සලකති, මෙය හැර අන් කිසි තැනක ඔවුන් යථාර්ථය නොදකිති.

රටේ නායකත්වය උමර් ඉබ්න් අබ්දුල් අසීස් (රලි)ට පැවරී, රට වැසියන් ඔහුට පක්ෂ භාවයේ දිවුරුම් දුන් විට, ඔහු ඉතාමත් අසහනයෙන් සහ ආයාසයෙන් නිවසට පැමිණියේය. ඔහුගේ නිදහස් ලැබූ සේවකයා “ඔබ තුමාව මෙවැනි අසහන හා ආයාසයෙන් දකින්නේ ඇයි? මෙවැනි අවස්ථාවක ඔබ තුමා සිටිය යුත්තේ මෙසේ නොවේ.“ යයි කීය. එයට උමර් ඉබ්න්

අබ්දුල් අසීස් (රළි) “නුඹට විනාශයම වේවා. නැගෙන හිර හා බටහිර අතර ජීවත් වන ජනයාගෙන් තම අයිතීන් ලිඛිතව හෝ වාචිකව මගෙන් ඉල්ලීම් නොකරන හෝ තව කෙනෙක් සමග වූ ගැටලුවකට විසඳුමක් ඉල්ලීම් නොකරන හෝ කිසිවෙක් නොමැති විට, (එනම් සියලු දෙනාම මගෙන් කුමක් හෝ ඉල්ලීම් ඉදිරිපත් කරමින් සිටියදී.) මම අසහනයෙන් නොසිටින්නේ කෙසේදැ?“ යි විමසිය.

මුස්ලිම් ජනතාවගේ ඉරණම පිළිබඳ තීරණයක් ගැනීමේ අවශ්‍යතාව තිබෙන අවස්ථාවකදී අසහනය අධික වන බව නම් සැබෑය. උමර් ඉබ්න් අල් කත්තාබ් (රළි) මරණයෙන් පසුව ඉස්ලාමීය රාජ්‍යයේ කලීෆා පදවියට කෙනෙක් තේරීමේ කාර්ය අබ්දුල් රහුමාන් ඉබ්න් අවුෆ් (රළි) තුමාට භාර කරනු ලැබූ අවස්ථාවේදී, අබ්දුර් රහ්මාන් (රළි) මහළු කාන්තාවන් ඇතුළු මුස්ලිම්වරුන් බොහෝ දෙනෙකුගෙන් අදහස් විමසමින් සිටීමෙන් ඔහුට නිදා ගන්නට පවා අමතක විය. මෙවැනි තවත් වැදගත් අසහන තත්ත්වයක් නම්, දාඊ වරයෙක් අල්ලාහ්ගේ වදන හා ඉස්ලාමීය නිවේදනය අන් අයට පහදා දීමටද යහ මග පෙන්වීමටද වෑයම් කරන විට සිටින මානසික තත්ත්වයයි. නැමදුම් කරන කෙනෙක් තම නැමදුම් වතාවත් හා චේතනාව නිවැරදි බවට වග බලා ගැනීම සහ මුස්ලිම් වරයෙක් ලෝක මුස්ලිම් සහෝදර වරුන්ගේ වේදනාව ගැන අසහනයට පත් වීම මෙයින් තවත් උදාහරණයකි.

පාප ක්‍රියාවන් සිදු කිරීමෙන් සිතේ පැන නගින අසහනය විවිධය. එවා නම් නීති විරෝධී ලෙස ලේ සැලීමෙන් පසු සිදු වන කම්පනය, හෝ කාමයේ අනාචාරව හැසිරීමේ වරද සිදු කළායින් පසුව පැන නගින කම්පනය හෝ මෙවැනි ක්‍රියාව තුළින් ගැබ් ගන්නා කාන්තාවක් පසුවන කම්පනය යන සමහරකි.

අන් අයගෙන් සිදු වන අයහපත් සැලකිලි නිසා හට ගන්නා සංවේගය අතරින්, සිය ඥාතීන්ගෙන් ලැබෙන අයහපත් සැලකිලිද වේ. මන්ද සමීප ඥතීන්ගෙන් සිදු වන අයහපත් සැලකිලි තියුණු පිහියකින් සිදු වන කායික තුවාලයකට වඩා අධික වේදනාව ගෙන දෙයි.

ලොවෙහි සිදු වන විපත්තිය නිසා කෙනෙක් ලක් වන පීඩාව නොයෙක් ආකාරයේ ඒවාය. අසනීප, දරුවන් දෙමාපියන්ට අකීකරු වීම, බිරියගේ එදිරිවාදි හැසිරීම, හෝ සැමියාගේ අකාරුණික සැලකිලි යනු එයින් සමහරකි.

ඇතැම් අසහනය හටගන්නේ අනාගතයේ කුමක් සිදු වේ දැයි බිය හේතු කොට ගෙනයි. තම මරණයට පසු දරුවන්ට, විශේෂයෙන් ඔවුන් දුබලව සිටින්නේ නම් ඔවුන්ට කිසිවක් ඉතිරි කිරීමට නොහැකිව කුමක් සිදුවේදැ යි පියෙක් සිත් කනස්සල්ලට ලක් වීම එක් නිදසුනකි.

මේවා කෙනෙකුගේ ආතතියට හා කනස්සල්ලට හේතුවන විවිධ නිදසුන්ය. ඒවා ගැන විස්තරාත්මක සොයා බලමු.

## 1. විවිධ වර්ගයට අයත් ආතතිය සහ කනස්සල්ල

යහ මාර්ගයට ඇරයුම් කරන්නෙක් තුළ හට ගන්නා අසහනය ගැන බලමු. මෙවැනි අසහනයට විශාලව, නබි වරු සහ රසූල් වරු පත් වූහ. ආයිෂා (රලි) තුමිය තම සහෝදරයාගේ පුත්‍ර උර්වා ට මෙසේ පැවසුවාය.

“උහුද් සටන දිනට වඩා ඔබ තුමාණන් කිසි විටක පීඩාවට පත්වුණේ දැ“ යි රසූල් (සල්) තුමාණන් ගෙන් විමසුවෙමි. එවිට

“ඔබේ ජනයාගෙන් එයට වඩා ඉමහත් පිඩාවට පත් වුයෙමි. අකබා දිනයේ ඉතාමත් බරපතළ පීඩාවට පත් වුයෙමි. එහිදී අබ්දු යාලයිල් ඉබ්න් අබ්දු කලාල් වෙතට ආයාචනා කළෙමි. එහෙත් බලාපොරොත්තු ආකාරයට ඔහුගෙන් ප්රතිචාරයක් මට නොලැබුණි. ඔහුව අත හැර දමා, යන්නේ කෙහේදැයි නොදැන ගියෙමි. කර්න් අල් තාලිබ් නම් ස්ථානයේ හිස ඔසවා අහස දෙසට නෙත් යොමු කළ විට වලාකුළු මට සෙවණ දෙනු දුටුවෙමි. එහි දී ජිබ්රීල් (අලෛ) දුටුවෙමි. එතුමා මා අමතා, “ඔබේ ජනතාව ඔබට පැවසූ දේ සහ ඔබට ඔවුන් දැක් වූ ප්‍රතිචාරයට අල්ලාහ් සවන් දුන්නේය. ඔහු (අල්ලාහ්) කඳු වැටි භාරව සිටින මලාඉකාවරයා, ඔබ පවසන දේ ඉටු කරනු පිණිස එවා ඇත.“ යනුවෙන් කීය. කඳු වැටි භාරව සිටින මලාඉකාවරයා මට ආචාර කර, “මුහම්මද් (සල්) තුමාණනි! ඔබ පතන්නේ නම් මේ කඳු දෙක අතර ඔවුන් සියලු දෙනා නෙරපා දමන්නෙමි.“ යයි පැවසීය. එයට “අල්ලාහ්ට කිසිවක් ආදේශ නොකර අල්ලාහ්ට පමණක් නැමදුම් කරන තවත් පරපුරක් ඔවුන්ගෙන් අල්ලාහ් බිහි කරනු ඇතැයි මම විශ්වාස කරමි.“ යනු පැවසුවෙමි.

නබි (සල්) තුමාගේ ඉස්රා නම් රාත්‍රි ගමන ගැන එතුමාගේ ජනතාව විශ්වාස නොකළ අවස්ථාවේදී එතුමා මේ ආකාරයටම මහත් මානසික පිඩනයට පත් විය.

“මක්කාවේ හරම් නම් කඳු පෙදෙසෙහි සිටින විට කුරෙයිෂි වරු මා වට කර ගෙන මගේ රාත්‍රි ගමන ගැනද, මම හරියාකාරව නොදන්නා බයිත් අල් මුකද්දිස් ගැනද නොයෙක් ප්‍රශ්න ඇසුහ. මම මහත් මානසික පීඩනයට පත් වුයෙමි. එම අවස්ථාවෙහි, අල්ලාහ් එය (බයිත් අල් මුකද්දිස් මස්ජිදය) මාගේ දෑස් ඉදිරියෙහි ගෙනැවිත් පෙන්වීමෙන් ඔවුන් අසන ප්‍රශ්න කුමක් දැයි දැන ගෙන නිසි පිළිතුරු දුන්නෙමි“. යයි නබි

(සල්) තුමාණන් දැන් වූ බව අබු හුරෙයිරා (රලි) වාරතා කරයි. (මුස්ලිම්)

## 2. නැමදුම් පිළිබදව සංවේගය

සලාහ් පිළිබඳව ජනතාවට කරුණු කියා දෙනු පිණිස රසූල් (සල්) තුමාණෝ අධික සංවේගයට පත් වූහ. අබු උමෙයිර් ඉබ්න් අනස් (රලි) තුමා, තම පියාගේ අන්සාරි සොයුරන්ගෙන් තොරතුරු ලැබ මෙසේ දන්වයි. "මුස්ලිම්වරු සලාහ් සදහා රැස් කිරීමට ඇරයුම් දීමේ ක්‍රමය පිළිබඳව රසූල් (සල්) තුමාණෝ මහත් සංවේගයට පත් ව සිටියහ. ධජයක් ඔසවන ලෙසද, එය දකින අය අනිත් අයට දැන්විය හැකි බව කෙනෙක් අදහස් දැක් විය. මෙම අදහසට රසූල් (සල්) තුමාණෝ කැමති නොවිය. යුදෙව් ජාතීන් භාවිතා කරනවාක් මෙන් බැටළුවාගේ අඟින් සෑදූ නළාවක් තවත් කෙනෙක් යෝජනා කළේය. මෙය යුදෙව් ජාතීන්ට අයත් එකක් යයි එතුමාණෝ කීහ. තවත් කෙනෙක් සීනුව නාද කරන ලෙස අදහස් එල කළේය. මෙය ක්‍රිස්තියානි බැතිමතුන්ට අයත් එකකි යයි නබි (සල්) තුමාණෝ එය ප්‍රතික්ෂේප කළහ. අබ්දුල්ලාහ් ඉබ්න් සෙයිද් ඉබ්න් අබ්දු රබ්බිහී (රලි) මෙම අවස්ථාවේ එතැනින් ඉවත් වූයේ රසූල් (සල්) තුමාණන්ගේ සංවේගය ගැන සිත් තැවිල්ලෙන්ය. එදා රාත්‍රියෙහි සිහිනයකින් අදාන් ක්‍රමය අල්ලාහ් ඔහුට පෙන්විය. පසු දින උදයේ ඔහු රසූල් (සල්) තුමාණන් වෙතට පැමිණ තමා දුටු සිහිනය ගැන කීය. "රසූල් (සල්) තුමාණනි, ඊයේ රාත්‍රියෙහි මම අඩ නින්දේ සිටිනා විට, කෙනෙක් පැමිණ අදාන් ක්‍රමය මට පෙන්විය. . . . . . . ."

## 3. අසත්‍ය චෝදනාවට ලක් වූ සත්‍යවාදියෙකුගේ අසහනය

zසෙයිද් ඉබ්න් අල් අර්කාම් නම් ප්‍රබල සහාබාවරයෙකුට මෙවැන්නක් සිදුවිය. මුනාෆික් වරුන්ගේ නායකයා, "අපි

මදීනාවට හැරී ගිය විට ගෞරවය හා බලය ඇති තැනැත්තා (ඔහු) නින්දාවට පත්වූ තැනැත්තා (නබි සල් තුමා)ව ඔහුගේ සගයින් සමග පිටු වහල් කරන්නේය."යනුවෙන් තම මිත්‍රයන්ට පවසනු මෙම සහාබිවරයා සවන් දුන්නේය. zසෙයිද් (රලි) තව දුරටත් මෙසේ පවසයි. "මම මගේ පියාගේ සොයුරාට මේ බව කීවෙමි. ඔහු නබි (සල්) වරයා වෙතට ගොස් මෙම සිද්ධිය ගැන දැනුම් දුන්නේය. නබි (සල්) වරයා, මුනාෆික් වරුන්ගේ නායක අබ්දුල්ලාහ් ඉබ්න් උබෙයි ගෙන්වා මේ ගැන විමසූ විට, ඔහු මෙවැනි කිසිවක් නොපැවසූ බව දිවුරා කීවේය. අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණෝ ඔහුගේ කථාව විශ්වාස කළ නමුත් මගේ වචන විශ්වාස කළේ නැත. මගේ බාප්පා පැමිණ "නුඹට අවශ්‍ය වුණේ රසූල් (සල්) වරයා සහ මුස්ලිම්වරු නුඹව විශ්වාස නොකර නුඹට පිළිකුල් කිරීමටයි." යනු මට බැණ වැදුණි. අන් කිසිවෙක් ලක් නොවු අයුරින් මම මහත් මානසික පීඩාවට හා ආතතියට පත් වුයෙමි. දිනක් රසූල් (සල්) වරයා සමඟ ගමනක සහභාගි වූ විට, අධික කනස්සල්ල නිසා හිස නමා ගෙන සිටියෙමි. රසූල් (සල්) තුමාණෝ මා වෙතට පැමිණ, මගේ කනෙන් මිරිකා මද සිනහවක් පෑවේය. එ මොහොතේ මා ලැබූ සතුට වෙනුවෙන් මේ ලෝකයේ කිසිඳු සතුටකට මම සමාන නොකරන්නෙමි. අනතුරුව අබූ බකර් (රලි) පැමිණ රසූල් (සල්) වරයා කුමක් පැවසුවා දැයි විමසිය. "එතුමා කිසිවක් නොපැවසූ නමුත් මගේ කන මිරිකා මා දෙස බලා මද සිනහවක් පෑවේය." යි පැවසුවෙමි. "සතුටුවන්න" යැයි අබූ බකර් (රලි) මට කීහ. ඉන් අනතුරුව උමර් (රලි) පැමිණ විමසූ විට අබූ බකර් (රලි) තුමාට පැවසූ දේ එතුමාටත් කීවෙමි. පසු දින අලුයම සලාවෙහි රසූල් (සල්) වරයා අල් කුර්ආනයේ 63 වන මුනාෆිකීන් සූරාව පාරායනා කළේය."

එම සිද්ධිය පිළිබඳව ඉමාම් මුස්ලිම් මෙසේ වාර්තා කරයි. "zසෙයිද් (රලි) මෙසේ දැන්විය. මම නබි (සල්) වරයා වෙත පැමිණ ඔවුන් කථා කළ දේ ගැන පැවසුවෙමි. නබි (සල්) වරයා අබ්දුල්ලාහ් ඉබ්න් උබෙයි ගෙන්වා ඔහුගෙන් මෙ ගැන ප්‍රශ්න කළහ. එවිට ඔහු එවැනි කථාවක් නො පැවසූ බව දිවුරා

කියමින් රසූල් (සල්) වරයාට zසෙයිද් (රලි) බොරු පවසන බවද චෝදනා නැගුවේය. ඔහු පැවසු දේ ගැන අධික ලෙස සිත් තැවිල්ලට පත්වූ යෙමි. එවිට අල්ලාහ් මගේ සත්‍යතාවය සනාථ කරන වදන් කිහිපයක් පහළ කෙළේය. (*ආත්ම වංචනිකයින් ඔබ වෙත පැමිණිය හොත් 'සැබැවින්ම ඔබ අල්ලාහ්ගේ රසූල්වරයා යයි අපි සාක්ෂි දරමු.' යයි කියති. ඔබ ඔහුගේ රසූල් වරයා යයි අල්ලාහ් දන්නේය. අත්ම වංචනියෝ බොරු කාරයෝ යයි අල්ලාහ් සාක්ෂි දරන්නේය.*) අල් කුර්ආන් 63: 1.

## 5. අසත්‍ය චෝදනාවට ලක් වූ අහිංසකයෙකුගේ අසහනය

අයිෂා (රලි) තුමියගේ සිද්ධිය මෙයට හොඳ නිදසුනකි. මුරෙයිසි ගමනේ දී එතුමිය පාපයක් සිදු කළ බව මුනාෆික්වරු චෝදනා නැගුහ. අසනීපයෙන් පසු වූ එතුමිය මෙම අපවාදය ගැන තම නිවසේ සේවිකාව ගෙන් දැන ගත් විගස තවත් අසනිප වුවාය. එතුමිය මෙසේ පැවසීයි. "මම, 'සුබ්හානල්ලාහ්, මිනිස්සු ඒ ලෙස කථා කරනවාදැ?'යි පැවසුවෙමි. එදා රාත්‍රී එළිවන තුරු මම කඳුළු සැලුවෙමි. මම නිදා නොගත්තෙමි. මගේ කඳුළු නොනැවතුනි. රාත්‍රී දෙකක් හා දහවලක් මම නොනැවතී කඳුළු සැලීමෙන් පසු මගේ දෙමාපියන් මා වෙතට පැමිණියහ. මගේ දෙමාපියන් සමග සිටින විට අන්සාර් කාන්තාවක් මා දැකගන්නට අනුමැතිය ඉල්ලුවාය. මම ඇයට අනුමත දුන් විට ඇයද මා ළග වාඩි වී කඳුළු සැලුවාය. අපි එසේ සිටියදී අල්ලාහ්ගේ රසූල් (සල්) වරයා පැමිණ අපට සලාම් පවසා අසුන් ගත්තේය. මෙම අපවාදය පටන් ගත් දින සිට එතුමා මාව බලන්නට නොපැමිණි අතර, මාගේ තත්ත්වය සම්බන්ධව කිසිදු කුර්ආන් වාක්‍යයක් පහළ වී නැත. වාඩි වී සිටි අල්ලාහ්ගේ රසූල් (සල්) වරයා ෂහාදා පවසා. "ආයිෂා, ඔබ ගැන මේ මේ අයුරින් කථා ඇසුවෙමි. ඔබ නිර්දෝෂි නම්,

අල්ලාහ් ඔබගේ නිර්දෝෂී භාවය තහවුරු කරයි. ඔබ වරදක් කළේ නම්, අල්ලාහ් වෙත පසුතැවිලි වී පාප ක්ෂමාව අයැදිනු. මන්ද, අල්ලාහ්ගේ ගැත්තෙක් පසුතැවිලි වී ක්ෂමාව අයැදින විට, ඔහුගේ පසුතැවිළි අල්ලාහ් පිළිගනියි." යනුවෙන් පැවසීය.

රසූල් (සල්) තුමාණෝ පවසන්නට තිබූ දේ අවසන් කළ විගස මාගේ කඳුළු සැලීම නැවතුණි. "රසූල් (සල්) වරයා පැවසූ දේට ප්‍රතිචාර දක්වන්න" යැයි මගේ පියාට පැවසුවෙමි. "අල්ලාහ් මත දිවුරා කියමි. රසූල් (සල්) වරයා ට කුමක් පවසන්න දැයි නොදනිමි." යැයි මගේ පියා කීවේය. "රසූල් (සල්) වරයා පැවසූ දේට ප්‍රතිචාර දක්වන්න" යැයි මගේ මවට පැවසුවෙමි. "අල්ලාහ් මත දිවුරා කියමි. රසූල් (සල්) වරයා ට කුමක් පවසන්න දැයි නොදනිමි." යැයි මගේ මව ද කීවාය.

එවිට මම මෙසේ පැවසුවෙමි. "මම තවම ළාබාල තරුණියෙක්. අල් කුර්ආනය ගැන මම අධිකව නොදනිමි. අල්ලාහ් මත දිවුරමි. යූසුෆ් (අලෛ) වරයා පැවසූ වදන් හැර මට වෙන කිසිවක් පවසන්නට නැත." "*. . . (මගේ ඉවසීම) හොඳ ඉවසීමක්ය. නුඹලාගේ විස්තර කිරීමෙහිලා අල්ලාහ් ගෙන්ය උදව් සෙවිය යුත්තේ.*" අල් කුර්ආන් 12-18.

ඉන් පසුව ඇඳේ අනෙක් පැත්තට හැරුණෙමි. එවිට සියලු කීර්ති හිමි අල්ලාහ් මෙම ශුද්ධ වූ කුර්ආන් වැකිය පහළ කළේය.

*"සැබැවින්ම මිත්‍යාවාදය ගෙන ආ අය ඔබගෙන් පිරිසකි එය ඔබට නරකයයි නොසිතවු. එය ඔබට හොඳය.. . . . ."* අල් කුර්ආන් 24: 11.

අයිෂා (රලි) තුමියගේ කාලයට පෙර ජේසු (අලෛ) තුමාගේ මව මර්යම් (අලෛ) තුමිය ද මහත් පීඩාවට හා සිත් තැවිල්ලට

පත්වූ වාය. අවිවාහක කන්‍යාවක් වන එතුමිය අල්ලාහ් ගේ "වේවා" (කුන්) යන අණට එකඟ ව ඉබේම ගැබ් ගත්තාය. මරියම් (අලෛ) තුමියගේ කනස්සල්ල අධික වූ විට මෙසේ පැවසුවාය.

*"....අහෝ, අහෝ මෙයට පෙර මම මැරුණා නම්, තවද මා ශූන්‍යයව මතක නැති වුවා නම් යයි ඈ කීවාය."* අල් කුර්ආන් 19: 23

එතුමිය මෙලෙස පැවසුවේ, සද්ධාවන්ත තරුණියක් වූ ඇය දෑතේ දරුවෙක් වඩා ගෙන තම ජනතාව මැදට පැමිණි විට ඔවුන් කුමක් පවසන්නෝ දැයි ඇය අවබෝධයෙන් සිටි නිසාය. නබි වරුන්ගේ පරපුරෙන් පැවති ඇය යහපත් පවුලකට අයත් වන අතර දෙවි මැදුරට සමීපව ජීවත් විය. මෙවැනි හේතූන් නිසා, ඇගේ සිත් තුළ මහත් කනස්සල්ලක් හට ගත් අතර, ඒ හේතුවෙන් මේවා කිසිවක් සිදුවන්නට පෙර තමා මරණයට පත් වුයේ නම් ද, තම ජනතාවගේ මතකයෙන් ඉවත් විය හැකි නම් - එනම් තමා කිසි විටක උපත නොලැබුවේ නම් සුදුසු යයි ද පැතුවාය.

## 5. අසත්‍ය චෝදනාවට ලක් වූ අවංක කාන්තාවකගේ කථාව

ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කළාය. "අරාබි වරයෙකුට අයත් කළු ජාතික කාන්තාවක් මුස්ලිම් බවට පත් වුවාය. මස්ජිදය තුළ ඇයට අයත් කුටියක් තිබුණි. විටින් විට අප වෙත පැමිණ කථා කිරීමට ඇය පුරුදුවී සිටියාය. දිනක්. "විෂා (කාන්තාවන් ඉණට බඳින ඉණ පටිය) දිනය අප පරමාධිපතිගේ හාස්කමකි. කුෆ්ර් (දේව විශ්වාසය නොමැති) රටකින් මා රැක ගත්තේ ඔහුමයි" යනුවෙන් ඇය පැවසුවාය. මෙලෙස ඇය කිහිප වරක් පැවසු විට, "ඉණ පටියේ දිනය යනු කුමක් දැ" යි ආයිෂා (රලි) තුමිය විමසුවාය. "අපේ ජනයාට අයත් තරුණියෙක් ඉණ පටියක් බැඳ ගෙන පිටතට ගිය විට, එය නොදැනුවත්ව ගැල වී වැටුණි. එය දුටු උකුස්සෙක් ආහාරයක්

යැයි සිතා එය ඩැහැ ගෙන ගියේය. එම ජනතාව මම එය සොරකම් කළේ යැයි සැක කර මට දැඩි ලෙස දඬුවම් දුන්හ. මගේ අභ්‍යන්තර ස්ථානයන් හී පවා ඔවුන් සෙවූ විට මම මහත් පීඩාවට හා සිත් තැවිල්ලට පත් වුයෙමි. මෙලෙස ඔවුන් මා වට කර ගෙන සිටියදී එම උකුස්සා ආපසු පැමිණ අර පටිය අප හිස මත වීසි කර දමා ඉගිලී ගියේය. ඔවුන් එය අහුලා ගත් විට 'ඔබ මම සොරකම් කළා යැයි අසත්‍ය චෝදනා නැගූ ඉණ පටිය මෙයයි. මම අවංක කෙනෙකි.' යනුවෙන් කීවෙමි."

### 6. තම මරණයෙන් පසු පවුලේ අය ගැන කනස්සල්ල

රසූල් (සල්) වරයා මෙසේ දැන් වූ බව අයිෂා (රලි) තුමිය වාර්තා කරයි. "ඔබට (එතුමාගේ බිරියන්) මගේ මරණයෙන් පසුව කුමක් සිදු වේදැයි මම සිත් කනස්සල්ලට පත් වෙමි. සැබෑ ඉවසීමක් සහිත කෙනෙක් හැර අන් කිසිවෙකුට ඔබව බලා ගත නොහැක."

## 7. ණය වීම සම්බන්ධව හට ගන්නා අසහනය

මෙයට නිදසුනක් වශයෙන් අල් සුzබෙයිර්(රලි) ගේ කථාව ඔහුගේ පුත්‍රයා අබ්දුල්ලාහ් ඉබ්න් අල් සුzබෙයිර්(රලි) පවසයි.

ජමල් සටනේ අල් සුzබෙයිර් නැගිට සිට මට අඬ ගැසුවිට මම ඔහු වෙතට ගියෙමි. "මාගේ පුත්‍රයාණනි, වරදක් කළ කෙනෙක් හෝ කාහට වරදක් කරනු ලැබුවේද, ඔහු හැර අන් කිසිවෙක් අද දින යුද්ධයේ මරණයට පත් වන්නේ නැත. වරදකට ලක් වූ කෙනෙක් වශයෙන් අද මම මරණයට පත් වන බව දනිමි. මගේ ණය මට අධික ලෙස පීඩා ගෙන දෙයි. ණය සියල්ල ගෙවා අවසන් වූ පසු අපේ ධනයෙන් යමක් ඉතිරි වේ දැයි ඔබ සිතනවාද? පුතේ! අපේ දේපොළ විකුණා දමා, ණය සියල්ල ගෙවා දමන්න." යි කීවේය. අබ්දුල්ලාහ් තව දුරටත් මෙස් දන්වයි. ණය පිළිබඳව මම කුමක් කළ යුතු දැයි මගේ පියා දිගින් දිගට උපදෙස් දුනී. "පුතේ, ණය කිසිවක් ගෙවීමට

නොහැකි වුවහොත්, මගේ මව්ලාගෙන් සහාය පතනු." යයි කීය. "ඔබේ මව්ලා කවුරුන් දැ" යි විමසුවිට "අල්ලාහ්" යනුවෙන් ඔහු පැවසීය. අල්ලාහ් මත (දිවුරා කියමි) ඔහුගේ ණය ගෙවන්නට මට අපහසු වූ සෑම විටකම, "සුzබෙයිර්ගේ මව්ලා (පරමාධිපතියාණනි!) ඔහුගේ ණය ගෙවා අවසන් කරනු මැනවි." යයි ප්‍රාර්ථනා කළෙමි. අල්ලාහ් ඔහුගේ ණය ගෙවා අවසන් කෙළේය. ඔහු ගෙවිය යුතු ණය ප්‍රමාණය ලක්ෂ විසිදෙකක් බව මම ගණන් බැලුවෙමි. (zසුබෙයිර්ගේ එවැනි විශාල ණය මුදලක් ගෙවා පියවන්නට නොහැකි වන බව zසුබෙයිර්ගේ ඇතැම් මිතුරන් පවා සිතුහ.) එහෙත් zසුබෙයිර්ගේ සමහර දේපොළ වලට අල්ලාහ් ආශීර්වාද කිරීමෙන් ඒවා බෙදා විකිණීමේදී නොසිතූ අයුරින් සියලු ණය ගෙවා අවසන් වූ පසු තවත් මුදලක් ඉතිරි වුණි. zසුබෙයිර්ට බිරියන් සිව් දෙනෙකි. ඔහුගේ ඉතිරි ධනයෙන් අටෙන් කොටසක් ඔවුන් සඳහා වෙන් කරන ලදි. ඔවුන් සෑම කෙනෙකුටම එක් මිලියන දෙලක්ෂ පණස් දහසක් ගෙවන ලදී. අවසානයේ zසුබෙයිර්ගේ ධනයේ සම්පූර්ණ වටිනාකම පනස් මිලියන දෙලක්ෂයක් විය.

## 8. සිහින දිටීමෙන් හට ගන්නා අසහනය

මෙවැනි දෙයක් නබි (සල්) තුමාණන්ට සිදු වූ බව පැවසුහ.

"මම නිදා සිටියදී, මහ පොලොවේ නිදන් මා වෙතට ගෙනෙන ලදුව, එයින් අතේ බඳින රන් බන්දි වළලු මාගේ අතේ බඳින ලදී. එයින් මම කනස්සල්ලට පත් වූ නමුත් ඒවා මත පිඹිය යුතුය යි අල්ලාහ් මට දැන් වූ විට මමද එලෙස කළ විගස, ඒවා ඉවත් විය. ඒවා දෙක මම මුහුණ දෙන ව්‍යාජ නබි වරු වන සනආ සහ අල් යමාමා පෙදෙසෙන් පැමිණි දෙදෙනා බව පහදා ගත්තෙමි."

ඉබ්න් උමර් (රලි) සහ ඔහුගේ පියාණන් ද ඔහු දුටු සිහිනයක් නිසා මහත් කනස්සල්ලට ලක් වුහ. මේ ගැන ඉබ්න්

උමර් (රලි) මෙසේ දැන්විය. රසූල් (සල්) වරයාගේ ඇතැම් මිතුරන් සිහින දුටුවේ නම් ඒ බව රසූල් (සල්) වරයා වෙතට පැමිණ දන්වති. එවිට රසූල් (සල්) තුමා “මාෂා අල්ලාහ්“ යනුවෙන් පවසයි. එවකට මම අවිවාහක තරුණයෙක් ව මස්ජිදයේ නවාතැන් ගෙන සිටියෙමි. ඔබෙන් යම් හොඳක් තිබුණේ නම් ඔබත් ඒ අය මෙන් යමක් (සිහිනයක්) දකින්නේය.“ යනු මටම පවසා ගත්තෙමි.

එදා රාත්‍රී නිදා ගන්නා විට, “යා අල්ලාහ් මා වෙත හොඳ කිසිවක් ඔබ දකින්නේ නම්, මටත් සිහිනයක් පෙන්වනු.“ යයි කීවෙමි. එදා රැයේ මලාඉකාවරු දෙදෙනෙක් පැමිණියහ. ඔවුන් දෙදෙනාගේ අතේ යකඩ තෝන් ලණුවක් තිබුණි. ඔවුහු මාව අපාය කෙරෙහි ඇද ගෙන ගියහ. එවිට මම ‘යා අල්ලාහ්, අපාය ගින්නෙන් ඔබ වෙත මම ආරක්ෂා පතමි.‘ යයි පැවසුවෙමි. පසුව යකඩ තෝන් ලණුවක් අතේ තබා ගත් මලාඉකා වරයෙක් දුටුවෙමි. ඔහු “නුඹ තවත් අධිකව නැමදුම් කරන්නේ නම් නුඹ යහපත් පුද්ගලයෙකි.“ යයි පැවසීය. මලාඉකාවරුන් දෙදෙනා අපායේ සමීපයටම මාව රැගෙන ගියහ. අපාය අං සහිත ළිඳක හැඩයෙන් තිබුණි. සෑම අං දෙක අතර යකඩ තෝන් ලණුවක් සහිතව මලාඉකා වරයෙක් සිටියේය. දන් වැල්හී පාදෙකෙන් එල්ලා තිබුණු මිනිසුන් දුටුවෙමි. ඔවුන් අතරින් ඇතැම් කුරෙයිෂිවරු මම හඳුනා ගත්තෙමි. පසුව ඔවුහු (මලක් වරුන්) මාව දකුණු පැත්තට රැගෙන ගියහ.

පසුදින උදයේ අවදි වූ විට මා දුටු දේ ගැන අධික ලෙස කනස්සල්ලට හා බියට පත් වී, හෆ්සා (රලි) තුමියට පැවසුවෙමි. “ඔබ දුටු දේ හොඳ එකකි.“ යයි ඇය පැවසුවාය. “රසූල් (සල්) තුමාණන්ගෙන් විමසන්න“ යනුවෙන් එතුමියට කී හෙයින් එතුමිය ද රසූල් (සල්) ට මේ ගැන පැවසුවාය.

“අබ්දුල්ලාහ් (රලි) ධර්මිෂ්ඨ පුද්ගලයෙකි. ඔහු රාත්‍රි සලාවෙහි නිරත වුයේ නම් “(හොඳයි) යනුවෙන් රසූල් (සල්) තුමාණෝ කීහ.

“එදා පටන් ඔහු (අබ්දුල්ලාහ් බින් උමර් රලි) සෑම රාත්‍රියෙහිම (අමතර) නැමදුමෙහි යෙදුණෝය.“ යනුවෙන් නාෆි වාර්තා කරයි.

## 9. බිහිසුනු සිහින දකින කෙනෙකුට විවිධ ප්‍රතිකාරය

මෙලොවෙහි විවිධ හේතුන් මත කනස්සල්ලට හා පීඩාවට පත් වීම පිළිබඳව විස්තර කිරීමෙන් අනතුරුව ඒවා ගැන ක්‍රියා කරන්නේ කෙසේ දැයි සාකච්ඡා කරමු.

අසහනයට සහ කනස්සල්ලට ලක් වීම ගැන සාකච්චා කිරීමේ දී පළමුව සැලකිල්ලට ගත යුත්තේ සිත් තැවිල්ල සම්බන්ධව කටයුතු කිරීමේදී ඒ තැනැත්තාගේ ඇදහිලි හා දේව විශ්වාසය සහ ඒවායෙන් ලැබෙන ආවරණයයි. දොම්නස, සිත් කලකිරීම හෝ බලාපොරොත්තු සුන්වීම වැනි අවස්ථාවන් හී දේව විශ්වාසයක් නොමැති කාෆිර් ජනතා හා දුබල ඊමානය සහිත මුස්ලිම්වරු සිත් තැවිල්ලෙන් නිදහස් වීම පිණිස සිය දිවි හානි කිරීමේ විනාශකාරි ක්‍රියාවෙහි යෙදෙනු අපි දකිමු. ආත්ම විනාශයට පෙළෙඹීම, ස්නායු සංගත්වයට (Nervous Breakdown) භාජන වීම හෝ වෙනත් මානසික කම්පනයට ලක් වීම වැනි රෝගීන් රෝහලේ පිරී සිටිති. මෙම ව්‍යසනයට දුබල අය පමණක් නොව ශක්තිමත් පුද්ගලයින් ලෙස සැලකෙන අයද භාජන වෙති. මෙම අවාසනාවන්ත ජනතාව, ක්‍රියා කිරීමේ සම්පූර්ණ අසමත්කම සහ මානසික ස්වස්ථායි භාවය (sanity) නිතරම අහිමි කර ගනිති.

ඉස්ලාමයට මාර්ග පෙන්වනු ලැබූ කෙනෙක්, ඔහුගේ ඇදහිලි නොවැරදි නම්, ඔහුගේ දේව විශ්වාසය ශක්තිමත් නම්, සර්ව ඥාන හා සර්වඥ, සියලු දේ මවා ඒවා සියල්ලට යහපත් දේ කුමක් දැයි නිසියාකාරව දන්නා අල්ලාහ්ගෙන් තමාට අවශ්‍ය ප්‍රකාරය දැක ගනී.

*"ඔහු නිර්මාණය කළා වූ දැය ඔහු නොදන්නේද? ඔහු (වහලාට) අති සියුම් කැරුණිකය, සර්වඥානය."* අල් කුර්ආනය 67:14.

## 10. අසහනය සහ කනස්සල්ල සඳහා ඉස්ලාමයේ ඇතැම් ප්‍රතිකාර

ඉස්ලාම් උගන්වන විවිධාකාර ප්‍රතිකාර සහ පිළියම් පිළිබඳව මෙහි සාකච්ඡා කරමු.

### අ. ස්ථිර ඊමානය සහිතව යහපත් ක්‍රියාවන්හී නිරතවීම

අල්ලාහ් මෙසේ පවසයි. *"පුරුෂයෙකුගෙන් හෝ ස්ත්‍රියකගෙන් හෝ යමෙක් ඔහු විශ්වාස කරන්නෙකුත් වී යහ කමක් කෙරේද, සැබැවින්ම අපි ඔහුට යහ දිවිපෙවෙතක් දෙන්නෙම් මයි. තවද අපි ඔවුන්ට ඔවුන් කෙරෙමින් හුන් ඉතා හොඳ දැයින් ප්‍රමාණයෙන් ඔවුන්ගේ ඵල විපාක දෙන්නෙම්මය."* අල් කුර්ආන 16: 97

මෙයට හේතුව ඉතා පැහැදිලිය. අල්ලාහ් වෙත විශ්වාසය තැබූ ජනතාව එම නිවැරදි විශ්වාසය මගින් යහපත් ක්‍රියා ඉටු කිරීමට පොළොඹ වනු ලබන අතර, එ මගින් ඔවුන්ගේ සිත් හි ගුණාංග ප්‍රතිසංස්කරණය කරනු ලැබීමද, ඔවුන්ගේ මෙලොව හා මතු ලොව තත්ත්වය වෙනස් වීමක්ද සිදුවේ. මෙවැනි ජනයාට මූලික ප්‍රතිපත්ති පිළිබඳව මනා අවබෝධයක් තිබෙන හේතුවෙන්, තමන් මුහුණ දෙන ඕනෑම සතුට හා පීඩාවට

නිසියාකාරව ප්‍රතිචාර දක්වන්නට හැකි වෙති. ඔවුන් ඕනෑම දැයක් පිළිගැනීමෙන් හා කෘතඥවීමෙන් අල්ලාහ්ගේ ආශීර්වාදය හා සතුට ලැබ ඒවා නිසි ලෙස යහපත් මාර්ගයේ යොදවති. මෙසේ කිරීමෙන් ඔවුන්ද සතුට ලබන අතර එය දිගු කාලීන ත්‍යාග සහ එයට අමතරව වෙනත් යහපත් දේ පිරිනමනු ලැබෙන බව බලාපොරොත්තු වෙන් ජීවත් වෙති.

හදීස් වදන - “විශ්වාන්තයෙකුගේ කාර්යය කෙතරම් විශිෂ්ටද? ඔහුට සිදු වන සෑම දෙයක්ම හොඳක්ය, මෙය විශ්වාන්තයෙකුට හැර අන් කිසිවෙකුට අදාළ නැත. ඔහුට යම් හොඳ දැයක් සිදුවුයේ නම්, ඔහු ඒ සඳහා ස්තූතිය ප්‍රකාශ කරයි, එය ඔහුට හොඳය. ඔහුට යම් අයහපතක් සිදු වුයේ නම් ඔහු එය ඉවසීමෙන් දරා ගනී. එයද ඔහුට හොඳය.“

කෙනෙකුට ව්‍යසනයක් සිදු වුයේ නම් එයට ඵලදායික චින්තනයෙන් මුහුණ දෙන ක්‍රමය මෙය වේ. තවත් උදාහරණයක් දෙස බලමු.

## ආ. පාපයන්හට ක්ෂමාව අයදින්නේ කෙසේදැයි සෙවීම

“අසනීපයක්, තෙහෙට්ටුවක්, දුකක්, පීඩාවක් හෝ කටුවක් ඇනීමෙන් විඳින වේදනාවක් වුවද අල්ලාහ් ඒ මගින් මුස්ලිම් වරයෙකුගේ ඇතැම් පාපයන් සඳහා ඔහුට ක්ෂමාව නොදී මිස එසේ සිදු කරවන්නේ නැත,“ යනුවෙන් රසූල් (සල්) තුමාණෝ පැවසුහ.

“ඔහුගේ ඇතැම් පාපයන් සඳහා ක්ෂමාවක් වශයෙන් මිස මුස්ලිම් වර යෙකුට අසනීපයක්, ප්‍රයාසයක්, දුකක් හෝ සිත් තැවිල්ලක් පවා සිදු වන්නේ නැත.“ යයි රසූල් (සල්) තුමාණෝ පැවසුවේය. මෙම හදීසය මුස්ලිම් වාර්තා කරයි.

ව්‍යසනයකට හෝ කනස්සල්ලට ලක් වූ කෙනෙක්, ඔහු පසු වන මානසික වේදනාව අපතේ නොයන බවද, ඒ සඳහා ඔහුගේ හසනාත් (කුසල්) ක්‍රියාව අධික වන බවද ඔහුගේ

සයිආත් (පාපයන්)ට සමාව ලැබෙන බවද දැන ගත යුතුයි. මෙලොවෙහි ව්‍යසනයක් හෝ පීඩාවක් තමාට සිදුනුවුයේ නම් යළි නැගිටින දිනයේ තමා හිස් අතින් පැමිණීමට සිදු වන බව මුස්ලිම් වරයෙක් දැන ගත යුතුයි. ඇතැම් අය සහනයේ ජීවත් වන විට සතුටු වන අයුරින්ම සලංෆි යනුවෙන් හැඳින්වන ඇතැම් ජනතා කොටසක්, විපර්යාසයක් සිදු වුයේ නම් ඒ ගැන සතුටු වෙති.

කෙනෙකුට ව්‍යසනයක් සිදු වුයේ නම්, විශේෂයෙන් පාප ක්‍රියාවක් කළ විගස මෙලෙස ව්‍යසනයකට මුහුණ දෙන්නට සිදු වන විට එමගින් තම පාපයන්ට ක්ෂමාව ලැබෙන බව අවබෝධ කර ගත්තේ නම්, එවැනි අවාසනාවන්ත තත්ත්වයෙහි ඔහු සතුටු වනු ඇත. ඇතැම් සහාබාවරු මෙවැනි අවස්ථාවන්ට මුහුණ දුන්හ.

අබ්දුල්ලාහ් ඉබ්න් මුගෆ්ෆල් (රලි) මෙසේ වාර්තා කරයි. දිනක් මිනිසෙක් ජාහිලිය්යා නම් ඉස්ලාමයට පෙර වූ අන්ධකාර යුගයේදී ගණිකා වෘත්තියේ යෙදුනු කාන්තාවක් මුණ ගැසුනි. ඔහු ඇය සමඟ විහිළු කරමින් සිට ඇයව ස්පර්ශය කළේය. එවිට ඇය, “ප්‍රවේශම් වනු. අල්ලාහ් ජාහාලියියාව විනාශ කර ඉස්ලාමය ගෙන ආවේය.“ යනුවෙන් පැවසුවාය. ඔහු එතැනින් වහාම ඉවත් වී යනවිට බිත්තියකට වැදී ඔහුගේ මුහුණ තුවාල කර ගත්තේය. රසූල් (සල්) තුමාණෝ දුටු ඔහු සියලු විස්තර කීය. එවිට එතුමාණෝ. "ඔබ අල්ලාහ්ගේ දාසයෙකි. අල්ලාහ් තම දාසයාට හොඳක් සිදු කරන්නට කැමති විට ඔහුට දඬුවම ඉක්මන් කරයි. ඔහු (අල්ලාහ්) ඔහුගේ දාසයාට හොඳක් සිදු කරන්නට අකැමති නම් ඔහුගේ සියලු පාපයන් සඳහා දඬුවම් දෙන පරමාන්ත දිනය දක්වා ප්‍රමාද කරයි." යනුවෙන් පැවසූහ.

රසූල් (සල්) තුමාණෝ මෙසේ ද පැවසුවේය.

“අල්ලාහ් ඔහුගේ දාසයාට හොඳක් සිදු කරන්නට කැමති විට, දැසයාගේ පාපය සඳහා මෙලොවෙහි ඉක්මණිනින් දඬුවම් දෙයි. ඔහු (අල්ලාහ්) ඔහු(ගේ සේවකයා)ට හොඳක් සිදු

කරන්නට අකැමති නම් ඔහුගේ පාපයන්ට නිසි ලෙස දඬුවම් දීම යළි නැගිටවන දිනය දක්වා ප්‍රමාද කරයි."

## ඈ. මෙලොවේ යථාර්ථය පහදා ගැනීම

මෙලොව තාවකාලික බවද, මෙහි තිබෙන ඉමහත් සැප සම්පත් ඉතා අල්ප බවද, මේ ලොවේ සතුට සීමිත බවද විශ්වාසවන්තයා දනී. සුළු වශයෙන් සිනහව තිබුණද කඳුළු සලන්නට බොහෝ හේතුන් තිබේ. එහි සුළු වශයෙන් යමක් ලැබෙන නමුත්, නොලැබෙන දේ බොහෝමයක්ය. මෙම යථාර්ථය පිළිබඳව නබි (සල්) තුමාණෝ පැවසුවේ මෙසේය. "විශ්වාස වන්තයෙකුට මේ ලොව බන්ධනාගාරයක් වන අතර, කාෆිර් වරයෙකුට මෙය ස්වර්ගයකි."

මෙයට අමතරව මේ ලොව වෙහෙස, වේදනාව, දුක්ඛිතකම සහ පීඩාව වැනි දේ පවතින බැවින් මෙය අත හැර දමා යන විශ්වාසවන්තයන් සහනය ලබන බව දැන ගනී.

අවමගුල් පෙරහැරක් යනු දුටු රසූල් (සල්) තුමණ්, "ඔහු දැන් මිදුණේය. ජනතාවද ඔහු ගෙන් මිදුණු බව දනිති." යනුවෙන් පැවසු බව අබූ කතාදා ඉබ්න් රබී අල් අන්සාරි වාර්තා කරයි.

"අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණනි! ඔහු මිදුණු අතර ජනතාව ඔහු ගෙන් මිදුණු බව දන්නේ කෙසේද?" යයි සහාබාවරු විමසුහ.

එවිට රසූල් (සල්) තුමාණෝ "මරණයට ලක්වන විශ්වාසී දාසයෙක් මේ ලොවේ වෙහෙස හා වේදනා යන දැයින් මිදී අල්ලාහ්ගේ මෛත්‍රිය වෙතට ගියේය. විශ්වාසය නොමැති කැරලිකරුවෙක් මරණයට ලක් වන විට ලොවේ ජනතාව, මහ පොළොව, ගස් කොළ හා සතුන් ඔහු ගෙන් මිදෙන්නෝය." යනුවෙන් පැවසීය.

මරණය, විශ්වාස වන්තයෙකුට මේ ලොවේ ව්‍යසනය, කනස්සල්ල සහ වේදනාව යනාදියෙන් විරාමයක් ගෙන දෙන්නේය.

විශ්වාස වන්තයෙක් මරණයට ලඟා වන විට, කරුණාවේ මලාඉකාවරු ඔහු වෙතට සුදු සේද රෙදි ගෙනැවිත්, “අල්ලාහ්ගේ සතුට වෙතට, අල්ලාහ්ගේ කරුණාව වෙතට, අධික සුවඳ වෙතට හා ඔබ සමඟ කෝප නොවන පරමාධිපති වෙතට සහනයෙන් බැහැර වනු.“ යයි පවසති. එවිට (ඔහුගේ ප්‍රාණය) අධික සුවඳවත් කස්තූරි මෙන් (සිරුරෙන්) බැහැර වන විට මලාඉකාවරු එය තම අතිනතට මාරු කර ස්වර්ගයේ දොරටුව වෙතට ගෙන යති. පෘථිවියෙන් පැමිණි මෙම සුවඳ කෙතරම් සෞම්‍ය ද? විශ්වාස වන්තයින්ගේ ප්‍රාණයට එය ගෙන එන අතර, ඒ ගැන ඔවුන් සතුටු වෙති. දීර්ඝ කාලයක් නොදුටු කෙනෙක් යළි පැමිණි විට ලබන සතුට හා එය සමානය. "අසවලා කළේ කුමක්ද? අසවලා කළේ කුමක්ද?" යනුවෙන් ඔවුන් විමසති. එවිට (මලාඉකාවරු) "ඔහුට පාඩුවේ ඉන්න දෙන්න. ඔහු ලෞකික ව්‍යසනයෙන් තවමත් පෙළෙනවා. " යයි පවසති. "අසවල් තැනැත්තා ඔබ වෙතට පැමිණියේ නැද්ද" යනුවෙන් ඔහු විමසු විට "ඔහු අපායේ වළ වෙතට ගෙන යනු ලැබුවේය." යනුවෙන් ඔවුන් පවසති.

කාෆිර් වරයෙක් මරණයට ළඟා වන විට, දඬුවම් දෙන මලාඉකාවරු ඔහු වෙත ගෝනි රෙදි රැගෙනවිත්, "ඔබ කෙරෙහි අල්ලාහ්ගේ කෝපය සහිතව අල්ලාහ්ගේ දඬුවම වෙතට අතෘප්තියෙන් බැහැර වනු." යැයි පවසති. එවිට (ඔහුගේ ප්‍රාණය) පිළුණු මස් කබැල්ලක් සේ දුගඳ සහිතව බැහැර වන අතර, ඔවුන් එය පොළොවේ දොරටුව වෙත ගෙන යති. "කෙතරම් පිළිකුල් වූ දුර්ගඳක්ද එය?" යනු කුෆ්ෆාර් වරුන්ගේ ප්‍රාණය වෙතට ගෙන යනු තුරු ඔවුන් පවසති.

මෙලොව පිළිබඳ යථාර්ථය අවබෝධ කර ගත් විට. එහි සන්තාපය, වේදනාව, කනගාටුව සහ අසහනය යන දේ ඉවසීමෙන් දරා ගන්නට විශ්වාස වන්තයෙකුට හැකි වනුයේ,

මෙවා ලොවේ අත්‍යවශ්‍ය යෙන්ම සිදුවිය යුතු ස්වාභාවිකයේ කොටසක් බව ඔහු දන්නා නිසාය.

ඈ.නබි (සල්) තුමාණන්ගේ ආදර්ශය අනුගමනය කිරීම.

නබි (සල්) තුමාණෝ සහ එතුමාණන්ගේ ධාර්මික ජනතාව අන් අයට වඩා මෙලොවේ ව්‍යසනයට අධිකව ලක් වූහ. ඔවුන්ගෙන් සෑම කෙනෙක්ම අල්ලාහ් කෙරෙහි ඔවුනොවුන්ගේ විශ්වාසට සමානව පරීක්ෂණයට ලක් කරනු ලැබූහ. අල්ලාහ් කවරෙකුට ආදරය කරන්නේද ඔහුව පරීක්ෂණ වලට භාජන කරවයි.

සාද් (රලි) දිනක් නබි (සල්) තුමාණන්ගෙන් මෙසේ විමසීය.

"අල්ලාහ්ගේ රසූල් (සල්) වරයාණනි, ව්‍යසනයකදී අධිකව පීඩාව ලබන්නේ මිනිසුන් අතරින් කවුරුන්ද?"

එවිට රසූල් (සල්) තුමාණෝ "(ප්‍රථමයෙන්) නබිවරු, අනතුරුව ඔවුන්ට පසුව පැමිණෙන අය, අනතුරුව ඔවුන්ට පසුව පැමිණෙන අයවෙති. කෙනෙක් ඔහුගේ ඊමානයට සමානව පරීක්ෂණ කරනු ලබයි. ඔහුගේ ඊමානය ශක්තිමත් නම්, ඔහු ලක් වන පරීක්ෂණයද එය හා සමානව අධික වේ. කෙනෙකුගේ ඊමානය දුබල නම්, ඔහුගේ ඊමානයට සරිලන අන්දමින් ඔහු පරීක්ෂණයට ලක්වෙයි. අල්ලාහ්ගේ විශ්වාසවන්ත දාසයා පාපයන් ගෙන් තොරව පොළොව මත ගමන් කරන තුරු ඔහුට නොයෙක් දුෂ්කරතාවන්ට මුහුණ දෙන්නට සිදු වේ."

ඉ. මරණයෙන් මතු ජීවිතය තම ඉලක්කය කර ගෙනීම

මෙලොව ජීවිතය කෙරෙහි නිතර සිත යොමු කරන මිනිසාට එය ඉතා ප්‍රබල බවට හා අවුල් සහගත බවට ඔහුව පත් කරයි. මරණයෙන් පසු ජීවිතය ප්‍රධාන අරමුණ කර ගත් මිනිසාට, එය කෙරෙහි අධිශ්ඨාන සහිතව සිත යොමු කර ගන්නට අල්ලාහ් උපකාර කරන බව රසූල් (සල්) තුමාණෝ පැවසූහ.

"කවරෙක් මරණයෙන් පසු ජීවිතයේ ප්‍රධාන අරමුණ බවට පත් කර ගන්නේද, අල්ලාහ් ඔහුගේ හදවතට සාරවත් භාවය හා නිදහස දෙන්නේය. මේ මගින් ඔහු අරමුණ වෙත සිත යොමු කිරීමට හැකිව එමගින් සෑහීමටද පත් වන අතර ඔහු අකැමැති වුවත් මෙලොව ඔහු වෙතට ළඟා වන්නේය. කවරෙකු මෙලොව ජීවිතය අරමුණ බවට පත් කර ගන්නේද, අල්ලාහ් ඔහුගේ හදවතට දිළිඳුකම ගැන නිතර බිය උපද වන්නේය. මෙමගින් ඔහු කිසිවකට සිත යොමු කිරීමට නොහැකිව උමතු වන්නේය. මෙලොවේ ඔහුට පෙර නියම කරන ලද දේ හැර අන් කිසිවක් ලබන්නේ නැත." යනුවෙන් රසූල් (සල්) තුමාණෝ පැවසූ බව අනස් (රලි) දන්වයි.

ඉබ්න් කය්යිම් මෙසේ දන්වයි. "කවරෙක් අන් කිසිවක් ගැන නොතකා, මුළු දවසෙහිම අල්ලාහ් ගැන පමණක් සිත යොමු කරන්නේද, ඔහුගේ සියලු අවශ්‍යතා සර්ව බලධාරී අල්ලාහ් ඉටු කර ඔහුගේ සියලු සිත් කනස්සල්ල ඉවත් කරන්නේය. ඔහුගේ (මිනිසාගේ) හදවතට සහන සපයා අල්ලාහ් කෙරෙහි ආදරයෙන් එය පුරවන්නේය. අල්ලාහ්ව සිහි කිරීම පමණක් ඔහුගේ දිවෙහි ඉතිරිවන්නේය. ඔහුගේ සිරුරේ අවයවන් සියල්ල අල්ලාහ්ට පමණක් අවනතව ක්‍රියා කරන්නේය.

එහෙත් කවරෙක් මෙලොව හැර අන් කිසිවක් ගැන නොසිතා කාලය ගෙවන්නේ ද, ඔහුට ලොවේ ව්‍යසනය, අසහනය හා වේදනාව භුක්ති විඳින්නට අල්ලාහ් ඉඩ සලසන්නේය. ඔහුගේ ප්‍රශ්න වලට ඔහුම විසඳුම් සොයා ගැනීමටද, අල්ලාහ් හැර අනිකුත් මවනු ලැබූ දේ කෙරෙහි ඔහුගේ සිත යොමු කරන්නට ද මාර්ග සාදන්නේය. ඔහුගේ ඉන්ද්‍රියයන් අල්ලාහ් හැර අන් දේවලට අවනත වෙයි. ඒ

හේතුවෙන් ඔහු සත්ව ගණයට අයත් කෙනෙක් මෙන් අල්ලාහ් හැර අන් අයට සේවය කරන්නට වැර දරයි. අල්ලාහ්ගේ සේවයෙන් ඉවත යන සෑම කෙනෙක්ම, ඒවාට ආදරය දක්වමින්, ඒවාට වහල් භාවයෙන් බර උසුලන්නට සිදු වෙයි."

සර්ව බලධාරි අල්ලාහ් මෙසේ පවසයි. *"යමෙක් පරම දයාලුහු මෙනෙහි කිරීමෙන් වැලකෙන්නේද, අපි ඔහුට ෂෙයිතානයෙකු නියම කරන්නෙමු. ඔහු ඔහුට යහළුවෙකු වන්නේය."* 43-36

## 11. මරණය සිහිපත් කිරීම - විශ්මිත ඵලදායි ප්‍රතිකාරයකි

රසූල් (සල්) තුමාණෝ මෙසේ පැවසූහ. "ඔබේ සතුට විනාශ කරන මරණය ගැන නිතර සිහිපත් කරනු. අසීරු අවස්ථාවක සිටියදී මරණය සිහි කරමින්, ඔහුගේ තත්ත්වය පහසු බවට පත් නොවූ කිසිවෙක් නැත. එමෙන් ම සැහැල්ලු අවස්ථාවක සිටියදී මරණය සිහිකරමින්, ඔහුගේ තත්ත්වය අසීරු බවට පත් නොවූ කිසිවෙක් නැත. (එනම් අල්ලාහ් ඔහු කෙරෙහි තිබෙන ආදරය නිසා ඔහුව පරීක්ෂණයට ලක් කරන්නේය.)"

## 12. අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කිරීම

දුආ (ප්‍රාර්ථනා) කිරීම අධික ඵලදායි වන අතර එය රැකවරණය හා ප්‍රතිකාරයද වෙයි. ව්‍යසනයක් සිදු වූ අවස්ථාවකදී මුස්ලිම් වරයෙක් අල්ලාහ් වෙතට හැරී, ඔහුගෙන්ම රැකවරණය පැතිය යුතු බව රසූල් (සල්) තුමාණන්ගේ ආදර්ශය පෙන්වයි. අනස් (රළි) තුමා මෙසේ දැන්විය. "රසූල් (සල්) තුමාණෝ මදීනාවේ සිටියදී එතුමාණන්ට මම සේවය කළෙමි. එතුමාණෝ මේ ආකාරයෙන් ප්‍රාර්ථනා කරනු මම සවන් දුන්නෙමි. අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් හම්, වල් හස්zන්, වල් අජ්ස්෴, වල් කස්ල්, වල් බුහ්ෑල්, වල් ජුබ්න්, ව ළලඅද් දයින් ව ගලබත් අල් රිජාල්. (එහි අර්ථය මෙසේය.

ව්‍යසනයෙන්, ශෝකයෙන්, අසමත්කමින්, කම්මැලිකමින්, මසුරුකමින්, බියසුලුකමින්, ණය බරින් සහ අන් අය විසින් පරාජයට පත් කරනු ලැබීමෙන් අල්ලාහ් වෙත ආරක්ෂාව පතමි." ව්‍යසනයක් වැළකීම සඳහා මෙම දුආ මහත් ඵලදායි එකකි. කරදරයක් සිදු වූ පසු එයට ප්‍රතිකාර සෙවීමට වඩා එය වැළකීම ඉතා සුදුසුය.

අනාගතයේ කුමක් සිදු වේ දැයි කනස්සල්ලට පත් ව සිටින කෙනෙකුට පහත සඳහන් දුආව ඉතා ප්‍රයෝජනවත්ය. රසූල් (සල්) තුමාණෝ මෙසේ පැවසූ බව අබූ හුරෙයිරා (රලි) දන්වයි.

"අල්ලහුම්ම අස්ලිහ් ලි දීනි අල්ලදී හුව අම්රි ව අස්ලිහ් ලි දුන්යාය අල්ලදී ෆීහා මආෂි ව අස්ලිහ් ලි ආහිඃරති අල්ලදී ෆීහා මආදි ව අජ් අල්, අල් හයාත සිZයාදතන් ලී ෆී කුල්ලි හඃයිරී ව අජ් අල්, අල් මව්ත රාහතන් ලී මින් කුල්ලි ෂර්. (යා අල්ලාහ්, මාගේ දහම නිසියාකාරව මම පිළිපැදීම සිදු කරනු මැනවි. එය මත සියලු කටයුතු රැඳී පවතී. මෙ ලොව මත ඉටු කරන මගේ ජීවනෝපාය මට යහපකත් බවට පත් කරනු මැනවි. අවසාන නවාතැන වන මරණයෙන් පසු ජීවිතය යහපතක් බවට පත් කරනු මැනවි. මගේ ජීවිතයේ සියලු හොඳ දේ වැඩි කර, අයහපත් දැයන්හි අවසානයක් බවට මගේ මරණය පත් කරනු මැනව." කෙනෙකුට ව්‍යසනය හා වේදනාව සිදුවූ විට, ඔහුට දුආ ප්‍රාථනාවේ දොරටුව විවෘත වේ. එය කිසිවිටෙක වසනු නොලැබේ. කෙනෙක් අති නිර්ලෝභී පරමාධිපතිගෙන් ප්‍රාර්ථනා කළේ නම් ඔහු ප්‍රතිචාර දක්වා පිළිතුරු දෙයි.

අල්ලාහ් මෙසේ පවසයි. "*(අහෝ මුහම්මද්), මගේ වහලුන් මා ගැන නුඹෙන් ප්‍රශ්න කළහොත් ඇත්තෙන්ම, මා ඔවුන් සමීපයෙහිය. මට අඬ ගෑමට මම පිළිතුරු දෙන්නෙමි. ඔවුන් සන්මාර්ගයෙහි වනු පිණිස ඔවුහු මට පිළිතුරු දෙත්වා. මා කෙරෙහි විශ්වාස කෙරෙත්වා (යි පවසනු.)*" අල් කුර්ආන් 2-186

ව්‍යසනය හා අසහනය ඉවත් කොට සතුට ගෙන දෙන මෙම බලවත් දුආ ප්‍රාර්ථනාව සෑම කෙනෙක්ම පැවසිය යුතු බව රසූල් (සල්) තුමාණෝ උපදෙස් කළේය.

ව්‍යසනයට හා කම්පාවට ලක් ව පහත දැක්වෙන දුආ ප්‍රාර්ථනාව පවසන කිසිවෙකුට ඔහුගේ ව්‍යසනය හා කම්පාව ඉවත් කොට ඒ වෙනුවට අල්ලාහ් සතුට නොදී නැත.

"අල්ලාහුම්ම ඉන්නී අබ්දුක ඉබ්න් අබ්දික ඉබ්න් අමතික නාස්යතී බි යදික, මාදා ෆිය්ය හුක්මුක, අද්ලුන් ෆිය්ය කඩාඋක. අස්අලුක බි කුල්ලි ඉස්මින් හුව ලක සම්මය්ත බිහි නෆ්සක අව් අන්සzල්තහූ කිතාබික අව් අල්ලම්තහූ අහදන් මින් හෑල්කික අව් ඉස්ත තර්ත බිහි ෆී ඉල්ම් ඉල් ගය්බි ඉන්දක අන්තජ්අල් අල් කුර්ආන රබ්බී කල්බි ව නූර් සද්රි ව ජලා හුස්zනි. (අල්ලාහ් දෙවියනි, මම ඔබේ වහලෙකි. ඔබේ වහල්ලාගේ පුත්‍රයෙකි. ඔබේ සේවිකාවගේ පුත්‍රයෙකි. මගේ නළලෙහි කෙස් රොද නුඹේ අතෙහිය. මා කෙරෙහි නුඹේ ආඥාව සදා ඉෂ්ට වේ. මා කෙරෙහි නුඹේ නියෝගය සාධාරණය. නුඹ යොදා ගත් හෝ නුඹේ ග්‍රන්ථයේ හෙළි කළ හෝ, නුඹේ මැවීම් වලට ඉගැන් වූ හෝ නුඹ වෙත තිබෙන ගුප්ත දැනුමෙහි ආරක්ෂා කරන ලද හෝ නුඹේ සියලු නාමයන්ගෙන් අල් කුර්ආනය මාගේ හදවතේ ආලෝකය හා ජීව බවට පත් කරන ලෙසද මාගේ ව්‍යසනය හා කම්පනය ඉවත් කරන මෙන්ද ඉල්ලා සිටිමි."

"අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණනි, අපි මෙය ඉගෙන ගත යුතු දැ" යි සහාබා වරු විමසූ විට, "සැබැවින්ම, මෙයට සවන් දුන් සෑම කෙනෙක්ම මෙය ඉගෙන ගත යුතුය" යි එතුමාණෝ පැවසූහ.

මෙම හදීසය ඉතා වැදගත් කරුණක් පෙන්වා දෙයි. අල්ලාහ්ගේ ගැත්තෙක් තමා අල්ලාහ්ට හිමි කෙනෙක් බවද අල්ලාහ්ගෙන් හැර තමාට කිසිවක් කළ නොහැකි බවද, අල්ලාහ් හැර වෙනත් අධිපති කෙනෙක් නොමැති බවද, තමා අල්ලාහ්ගේ වහලෙක් විය යුතු බවද, පිළි ගත යුතුයි. එසමඟම තමා අල්ලාහ්ට යටහත් බව ප්‍රකාශ කළ යුතු බවද, අල්ලාහ්ගේ

ආඥාවට කීකරුවිය යුතු බවද, ඔහු තහනම් කළ දේ ගැන ප්‍රවේශම් විය යුතු බවද, අල්ලාහ් තමාට කැමැති ආකාරයට ඔහුව මෙහෙයුම් කරන බවද, ඔහුව පාලනය කරන බවද අවබෝධ කර ගෙන, අල්ලාහ්ට ඔහුගේ අවනතභාවය සහ පොරොන්දුව ක්‍රියාවෙහි යොදවා, අල්ලාහ්ගේ සියලු අලංකාරවත් නාමයන් මගින් ප්‍රාර්ථනා කර, ඉන් අනතුරුව අල්ලාහ්ගෙන් ඔහුගේ අවශ්‍යතා ඉල්ලීම් කළ යුතුය.

ආපදාව සහ අසහනයට පත් වන අවස්ථාවන් හී පැවසිය යුතු දුආ කිහිපයක් හදීස් සහ සුන්නාවෙහි සඳහන් ව තිබෙන අතර, ඒවායින් සමහරක් පහත දැක්වේ.

රසූල් (සල්) තුමාණෝ පීඩාවකට ලක් වු විට මෙසේ ප්‍රාර්ථනා කළ බව ඉබ්න් අබ්බාස් (රළි) වාර්තා කරයි.

"ලා ඉලාහ ඉල්ලල්ලාහ්. අල් අසීම් අල් හලීම්, ලා ඉලාහ ඉල්ලල්ලාහ්. රබ් අල් අර්ෂ අල් අධීම්, ලා ඉලාහ ඉල්ලල්ලාහ්. රබ්බුස් සමාවාති ව රබ්බුල් අර්ද් ව රබ් අල් අර්ෂ් අල් කරීම්. (අල්ලාහ් හැර නැමදුමට අන් කිසිවෙක් නැත. සර්ව ශක්ති සම්පන්න, සර්ව ඉවසීම සහිතය. අල්ලාහ් හැර නැමදුමට අන් කිසිවෙක් නැත. බලසම්පන්න රාජාසන හිමි පරමාධිපති, අල්ලාහ් හැර නැමදුමට අන් කිසිවෙක් නැත. ශක්තිමත් අහසෙහි අධිපති හා පොළොවට අධිපති, ශ්‍රේෂ්ඨ රාජාසනය හිමි අධිපති ඔහුය."

රසූල් (සල්) තුමාණෝ මානසික පීඩනයට පත්වන විට “යා හය්යු යා කය්යූම්, බි රහ්මතික අස්තගීත් - යා ජීවමාන. සදාතනික, නුඹේ කරුණා වෙන් මම සහාය පතමි.“ යනුවෙන් ප්‍රාර්ථනා කරන බව අනස් (රලි) වාර්තා කරයි.

“මානසික පීඩනයට පත් වන අවස්ථාවන්හී පැවසිය හැකි වදන් කිහිපයක් ඔබට උගන්වන්නද?“ යයි රසූල් (සල්) තුමාණෝ විමසුහ. “අල්ලාහ්, අල්ලාහු රබ්බී ලා උෂ්රිකු බිහි ෂෙයිඅන් - අල්ලාහ්, අල්ලාහ් මගේ පරමාධිපතියාය. ඔහුට මම

කිසිවක් ආදේශ නොකරමි." යනුවෙන් එතුමාණන් පැවසූ බව අස්මා බින්ත් උමෙයිර්(රලි) තුමිය දන්වයි.

පීඩනයකට ලක් වූ කෙනෙක් පැවසිය යුතු බව අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණෝ ඉගැන් වූ තවත් ප්‍රයෝජනවත් දුආ එකක් මෙසේ ය. "අල්ලාහුම්ම රහ්මතක් අර්ජූ ෆ ලා තකිල්නී ඉලා නෆ්සි තර්ෆත් අය්න් ව අස්ලිහ් ලී ෂඅනි කුල්ලහු. ලා ඉලාහ ඉල්ලා අන්ත". "යා අල්ලාහ්, ඔබේ කරුණාව මම බලාපොරොත්තු වෙමි. එබැවින් මගේ කටයුතු කිසිවක් ඇස් පිය හෙළන මොහොතකට වුවද මා භාරව නොතබනු මැනව. මගේ සියලු කටයුතු නිවැරදි කරනු මැනව. ඔබ හැර නැමදුමට සුදුසු වෙන කිසිවෙක් නොමැත."

කෙනෙක් මෙම ප්‍රර්ථනාවන්හී අර්ථය අවබෝධ කර ගෙන ස්ථිර විශ්වාසයකින් හා අවංක අරමුණකින් ප්‍රර්ථනා කර, අල්ලාහ්ගේ උපකාරය ගෙනදෙන යහ ක්‍රියාවන්හි නිරත වන්නේ නම්, අල්ලාහ් ඔහුගේ සියලු බලාපොරොත්තු හා ප්‍රාර්ථනා ඉෂ්ට කර ඔහුගේ පීඩනය සතුටක් බවට පත් කරයි.

මෙම ප්‍රාර්ථනාව ඔහු අවංක හදවතින් හා දැඩි විශ්වාසයෙන් ඉදිරිපත් කරන්නේ නම්, ඔහුගේ කනස්සල්ල ඉවත් වී සහනය ගෙන දෙනු ලබන්නේය. ව්‍යසනය හෝ පීඩාව හට ගත් විට අල්ලාහ්ට අවංකව කළ ප්‍රාර්ථනාවන්ට ප්‍රතිචාර දක්වා ඔවුන්ව හතුරන්ගෙන්, අනතුරෙන්, දියේ ගිලී යෑමෙන්, කුස ගින්නෙන් හෝ පිඩාවෙවන් අල්ලාහ් මුදා ගත් බොහෝ අවස්ථාවන් සම්බන්ධව ආගමික විද්වතුන් සඳහන් කර ඇත.

අල්ලාහ්ට ඉතා සමීප වූ හා කැප වු බැතිමතෙක් හා සහාබාවරුන් අතර විද්වතෙක් වූ අල් ආලා අල් හද්රමි (රලි) පිළිබඳව මෙහි සඳහන් කරමි. බහ්රේන් හී ඉස්ලාමයට එරෙහිව සටන් කළ පිරිස වෙත හද්රමි (රලි) තුමා ගොස් එහි එක් ස්ථානයක කූඩාරම් තැනුවේය. හිටිහැටියේ ඔවුන්ගේ බඩුබාහිරාදිය, ජලය හා සියලු ආහාර පොදි පටවා තිබුණු ඔටුවන් එතැනින් පලා ගියෝය. ඔවුන් පැලඳ සිටි ඇඳුම් හැර අන් කිසිවක් ඔවුන් වෙත නොතිබුණි. එය රාත්‍රි වේලාවක් නිසා.

එක ඔටුවෙක් වුවද නවත්වා ගන්නට ඔවුන්ට හැකිවුයේ නැත. එම සේනාව මහත් කම්පණයට හා පීඩාවට ලක් වූ අතර, එහිදී තම මරණය නියත බව විශ්වාස කළ ඔවුන් ගමේ තිබෙන තම දේපළ පවා එකිනෙකාට භාර කරන්නටද පටන් ගත්හ.

අල් ආලා ඔවුන් සියලු දෙනාට ඇරයුම් කර, මෙසේ කථා කළේය. "ජනතාවනි, ඔබ මුස්ලිම්වරු නොවේද? ඔබ අල්ලාහ්ගේ මාර්ගයේ වෙහෙස දරන අය නොවේද?" එවිට ඔවුන් සියලු දෙනා, "සැබැවින්ම, එය සත්‍යයකි." යනුවෙන් පිළිතුරු දුන්හ. "එසේ නම් ධෛර්යමත් වන්න. අල්ලාහ් කිසි විටෙක ඔබව මේ තත්ත්වයේම තබන්නේ නැත." යනුවෙන් පැවසීය.

අලුයම ෆජ්ර් සලාහ් සඳහා වේලාව පැමිණි විට ඔහු සගයන්ට ඇරයුම් කර සලාතය මෙහෙයුවේය. පසුව දණ ගසා වාඩි වී, තම සගයින්ද එසේ වාඩි කර, දෑත් ඔසවා දුආ ප්‍රාර්ථනා කරන්නට පටන් ගත් විට ඔහුගේ සගයින්ද එසේ කළහ. හිර නගින තුරු ඔවුන් මෙසේ නිරත වූහ. එසේ සිටියදී හිරු රශ්මිය නිසා නලියන මිරිඟු දිය ඔවුන්ට දිගින් දිගට පෙනුනු නමුත් ඔවුන් දිගටම දුආ කර ගෙන සිටියහ. අති උතුම් අල්ලාහ් ඔහු අසල විශාල දිය ඇලක් මැවූ විට, අල් ආලා (රලි) එය දෙසට ගමන් කළ විට සගයන්ද ඔහු පිටු පසින් ගියහ. ඔවුන් එහි ජලයෙන් පානය කර සිරුර සෝදා ගත්හ. අහසෙහි මුදුනට හිරු ළඟා වන්නට පෙර, ඔවුන්ගේ ඔටුවන් එකිනෙකා පොදි සමඟ සෑම දිසාවෙන් ඔවුන් වෙතට හැරී එන්නට පටන් ගත්හ. ඒවායින් කිසිවක් නැති වී ගොස් නැත. ඔටුවන්ටද ඔවුන් ජලය දුන්හ. එම ජනතාව මෙම ගමනේ දෑසින් දුටු හාස්කම මෙය විය. (අල් බිදායා ව අල් නිහායා - දික්ර් රිද්දත් අහ්ල් අල් බහ්රෙයින් ව අව්දාතිහිම්)

## 13. නබි (සල්) තුමාණන්ට සලවාත් කීම

කෙනෙකුගේ සිත් තැවිල්ල අල්ලාහ් ඉවත් කරන බලවත් මාර්ගයන් අතරින් මෙයද එකකි.

අල් තුෆෛයිල් ඉබ්න් උබෙයි ඉබ්න් කඅබ් (රලි) තම පියා මෙසේ දැන් වූ බව වාර්තා කරයි. රාත්‍රියෙන් තුනෙන් කොටස් දෙකක් පසු වූ පසු රසූල් (සල්) වරයාණෝ නැගිට මෙසේ කීහ. "ජනතාවනී, අල්ලාහ්ව මෙනෙහි කරනු. අල්ලාහ්ව මෙනෙහි කරනු. හොරණෑවේ පළමු වන නාද කිරීම පැමිණියේය. එය දෙවන වරට නාද කරනු ලබන්නේය. මරණය එහි සියලුම ඇඟවීම් සහිතව පැමිණියේය. මරණය එහි සියලුම ඇඟවීම් සහිතව පැමිණියේය." එවිට මම "අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණනි, ඔබ තුමාණන්ට මම අධිකව සලවාත් පවසමි. ඔබ තුමාණන්ට මාගේ දුආ වෙන් කොපමණ ප්‍රමාණයක් කැප කරන්නද?" යනු විමසුවෙමි.

"ඔබ කැමති ප්‍රමාණයක්." යනු එතුමණෝ කීහ. "කාර්තුවක්?" යනු විමසුවෙමි. "ඔබ කැමති ප්‍රමාණයක්. එය ඔබ වැඩි කළහොත්, එය ඔබටම යහපත්ය." යනු එතුමාණෝ කීහ. "තුනෙන් කොටස් දෙකක්" යැයි විමසුවෙමි. "ඔබ කැමති ප්‍රමාණයක්." යනු එතුමණෝ කීහ. "එවිට මම මගේ සලවාත් සියල්ල ඔබ තුමාට කැප කරන්නෙමි." යැයි කීවෙමි. එවිට රසූල් (සල්) වරයා, එසේ නම් ඔබේ සියලු සිත් තැවිලි භාර ගනු ලැබ ඔබේ සියලු පාපයන්ට සමාව දෙනු ලැබේ." යැයි කීහ.

## 13. අල්ලාහ් වෙත සියලු කරුණු භාර කිරීම.

කෙනෙක් පහත සඳහන් මේ විෂයයන් ගැන දැන ගන්නා කල්හී,

- අල්ලාහ්ට සියලු දේ සිදු කළ හැක;
- තම දාසයන්ට සියලු දේ තෝරා ගන්නේ ඔහු පමණය;
- දාසයන්ගේ සියලු කටයුතු ඔහු නඩත්තු කරයි;
- දාසයාට වඩා උසස් ලෙස ඔහුගේ කටයුතු නඩත්තු කරයි;
- දාසයාගේ අවශ්‍යතාව දාසයාට වඩා හොඳ හැටි ඔහු දනී;

- දාසයා කෙරෙහි අධික ලෙස අවංකව කරුණා සහිතය;
- අල්ලාහ් නියම කළ ප්‍රමාණයට වඩා දියුණුවීමක් හෝ පිරිහීමක් කෙනෙකුට සිදු නොවෙයි;
- අල්ලාහ්ගේ නියමය කිසිවෙකුට ඉක්මවිය නොහැක;
- අල්ලාහ්ගේ නියෝගය කිසිවෙකුට වෙනස් කළ නොහැක

මෙවැනි කෙනෙක් තම සියලු කටයුතු අල්ලාහ් වෙත භාරකර, අල්ලාහ්ට යටත් පහත් වෙයි. බලවත් රජ කෙනෙකු ඉදිරියේ වැටී නමස්කාර කරන දුබල වහලෙක් සේ, අති බල සම්පන්න අල්ලාහ් ඉදිරියේ අල්ලාහ්ගේ කැමැත්තට එකඟව යටපත් වෙයි. දාසයා තම සියලු බර හා අවශ්‍යතා, කිසිඳු අවශ්‍යතාවෙන් තොරවූ අල්ලාහ්ට භාර කිරීමෙන් අති කාරුණික හා දයාලු අල්ලාහ් ඔහුගේ වැහැස හා කනස්සල්ල ඉවත් කර ඔහුට සහන දෙයි. මෙමගින් දාසයාගේ සිතට ආශීර්වාද ලැබීමෙන් ඔහු මෙලොවෙහි සතුටු වෙයි.

එහෙත් තම සියලු කටයුතු තමන්ටම කර ගත හැකි බව සිතන කෙනෙකුට, අල්ලාහ් කෙරෙහි තම වගකීම ගැන නොසිතා, තමන් ගැන පමණක් සිතා, තමන්ගේ හැකියාවෙන් සියලු දේ ඉටු කළ හැකි බව සිතන කෙනෙක්ව අල්ලාහ් අත හැර දමයි. මේ හේතුවෙන් ඔහු නොයෙක් ව්‍යසනයන්ට, බිය, දුක, වැහැස සහ අවුලට පත් වෙයි. ඔහුගේ කිසිදු ක්‍රියාවක් පිරිසිදු නොවන අතර, ඔහුගේ පැතුම් කිසිවක් ඉෂ්ට නොවෙයි. ඔහු බර උසුලන ගවයෙක් මෙන් ක්‍රියා කරන නමුත් කිසිදු සතුටක් නොලබයි. අවසානයේ මරණයෙන් මතු ජීවිතයේ ඔහුට සහය වන්නට කිසිවෙක් නොමැත.

අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබා අල්ලාහ් වෙත සියලු කරුණු භාර කරන කෙනෙක්, මුළාවට ලක් නොවෙයි. ඔහු අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබා අල්ලාහ් ගේ ත්‍යාග බලාපොරොත්තුවෙන් ක්‍රියා කරන විට ඔහු ව්‍යසනයෙන් හා පීඩාවෙන් පමණක් නොව කායික හෝ මානසිකද රැකවරණය

ලැබ අධික ශක්තිය, විශ්‍රාන්තිය හා සතුටද ලබයි. තම ආත්මයේ පහත් තෘෂ්ණාවට එරෙහිව කවරෙක් සටන් කරන්නේද ඔහු සැබැවින්ම අල්ලාහ්ගේ සහාය ලබයි.

*"යමෙක් අල්ලාහ් කෙරෙහි විශ්වාස තබන්නේද, ඔහු ඔහුට සෑහේ."* අල් කුර්ආනය 65: 3

ඔහුගේ ආගමික හෝ ලෞකික කරුණු සියල්ල අල්ලාහ් භාර ගනී.

දැඩි සිතක් සහිතව, අල්ලාහ් කෙරෙහි ස්ථිරව විශ්වාසය තබන කෙනෙක් තම ඊමානය දුබල කරන කිසි දෙයකට මුළා නොවෙයි. අල්ලාහ් ඕනෑම අවස්ථාවක තමාව රැකගන්නට භාරව සිටින බව ඔහු විශ්වාස කරන හෙයින් ටික කලකින් ඔහුගේ සිත් තැවිල්ල ඉවත් වෙයි. එ බැවින් අපි සියලු දෙනා පීඩා හා අනතුරුවලින් ආරක්ෂා සහිතව තබා අප ඊමානය තර කරන ලෙස අල්ලාහ් ගෙන් දුආ කරමු.

## 15. පීඩා හා සිත් තැවිල්ලෙන් මිදීමේ තවත් මාර්ග කිහිපයක්.

අතීතයේ සිදු වූ දේ වෙනුවෙන් සිත් තැවිල්ලට පත් වීමෙන් කිසිදු ඵලක් නැත. එයට හේතුව අතීතයේ සිදු වූ දේ යළි නිවැරදි කළ නොහැකි වීමයි. එමෙන්ම අනාගතයේ සිදු විය හැකි දේ ගැන දැන්ම පීඩාවට පත්වීමෙන් කිසිඳු ඵලක් නැත. නබි (සල්) තුමාණෝ මේ කරුණු දෙකින්ම ආරක්ෂා පැතූහ. අල්ලාහ්ගේ දාසයා අද සිදු කළ යහපත් දේ උසස් ආකාරයට සිදු කරන්නේ කෙසේදැයි කල්පනා කර එය එලෙස ඉටු කර නිම කළ යුතුයි. මේ ලෙස තම කටයුතු පරිපූර්ණ කිරීම මගින් කනස්සලු හා පසුතැවිලි සියල්ල අමතක කරයි. දුආ කළ විට හෝ දුආ කරන ලෙස උපදෙස් කළවිට අල්ලාහ්ගේ ආරක්ෂාව හා ආශීර්වාද පතන ලෙස පමණක් නොව තම ක්‍රියාවන්ද පරිපූර්ණ කර අල්ලාහ්ගෙන් පැතූ ආරක්ෂාව ලැබෙන පරිදි වෙහෙස වී කටයුතු කරන ලෙස නබි (සල්) තුමාණෝ ආදර්ශය

පෙන්වූහ. එබැවින් මිනිසා ආගමික හා ලෞකික යහපත ඉල්ලා දුආ කරන විට අල්ලාහ්ගෙන් යහ ප්‍රතිඵලයක් ලබයි.

අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණන්ගේ මෙම හදීසය අබූ හුරෙයිරා (රලි) වාර්තා කරයි.

“දුබල විශ්වාසියාට වඩා දැඩි විශ්වාසියා අල්ලාහ්ට සමීපයි. ඔවුන් දෙදෙනාම යහපත්ය. ඔබට හොඳක් ගෙන දෙන දේ ගැන සිත යොමු කරන්න. අල්ලාහ්ගේ සහාය පතන්න, කිසිවක් කළ නොහැකි බව නොසිතන්න. ඔබට යම් පාඩුවක් සිදු වුයේ නම්, ‘මම මෙය කළේ නම් මෙවැන්නක් මට සිදුවන්නේ නැතය‘ යි නොපවසනු. ඒ වෙනුවට, මෙය අල්ලාහ්ගේ නියෝගය යි, ඔහු සිතූ දේ ඉටු කරන්නේමයි‘ යනු පවසනු. ‘මෙය කළේ නම්‘ (යන වදන ) ෂයිතාන්ට මාර්ගය විවෘත කරයි.“

මේ අයුරින්, එක අතකින් සෑම විටම අල්ලාහ්ගේ අණ පරිදි යහපත් දේ සඳහා වෙහෙස වීම, අල්ලාහ්ගේ සහය පැතිම, අපොහොසත් භාවය හෝ කම්මැළිකමට ඉඩ නොදීම වැනි විෂය හා අනිත් අතින් සිදුවී අවසන් වූ අතීතය ගැන පසුතැවිලි වීම, අල්ලාහ්ගෙන් කුමක් සිදුවේ දැයි අඩමානයට පත් වීම යන විෂය දෙක අතර සම්බන්ධකමක් රසූල් (සල්) තුමාණෝ ස්ථාපනය කළහ.

ඇතැම් විෂයන් වර්ග දෙකකට අයත් බව එතුමාණෝ පැවසුහ. එනම්, අල්ලාහ්ගේ දාසයා සම්පූර්ණයෙන් හෝ එයින් හැකි ප්‍රමාණයක් හෝ තමාට ආරක්ෂා කර ගත හැකි කොටසක් හෝ ලබා ගැනීම සඳහා වෙහෙස වීම. අනෙක, ඒවායේ බලපෑම් අවම කිරීමෙන්, අල්ලාහ්ගේ සහය පැතීමෙන්, අන් අය ගැන ඔහුට කිසිවක් නොකළ හැකි දේ පිළිබඳව සහනයට පත්වීම හා සියලු දේ සතුටින් පිළි ගැනීම.

මෙවැනි ප්‍රතිපත්තිය අනුගමනය කිරීමෙන්, කනස්සලු ඉවත් කර, සතුට ගෙන දෙන බව නිසැකයි.

ඉහත සඳහන් හදීස් වදන කෙනෙක් පීඩාවට හේතු වන කරුණු ඉවත් කර, සතුට ගෙන දෙන කරුණු පිළබඳව වැහැස දැරිය යුතු බව පෙන්වා දෙයි. වෙනස් කළ නොහැකි අතීතයේ අයහපත් දේ ගැන කල්පනා කිරීම අඥාන කමක් බව කෙනෙක් අවබෝධ කර ගත යුතුයි. එවැනි දේ ගැන බියක් සිතෙහි මවා සිත් තැවිල්ලට පත්වීම වෙනුවෙන් අල්ලාහ් ඒවා ඉවත් කරන බව විශ්වාසය තබා ජීවත් විය යුතුයි. තම විශ්වාසය අල්ලාහ් මත පමණක් තබා ක්‍රියා කළේ නම්, බිය හා සැක දුරු වන අතර අල්ලාහ්ගේ රැකවරණය හා සහය ලැබෙයි.

## 16. අල්ලාහ් නිතර මෙන් සිහි කිරීම.

දික්ර් - අල්ලාහ්ව මෙනෙහි කිරීම තුළින් බිය හා සැක දුරු කර, ආත්මාව සන්සුන් බවට පත් වීමේ අපූරුතම මාර්ගයකි.

“*විශ්වාස කොට අල්ලාහ්ව සිහි කිරීමෙන් ඔවුන්ගේ සිත් පිනා යන අය. දැන ගනු, අල්ලාහු සිහිකිරීමෙන්ය සිත් පිනා යන්නේ.*“ අල් කුර්ආන් 13: 28

මරණයේ ව්‍යසනයෙන් සහනය ලැබිය හැකි බලවත් වදන “ලා ඉලාහ ඉල්ලල්ලාහ්.“ (අල්ලාහ් හැර නැමදුමට සුදුසු කිසිවෙක් නැත)

දිනක් තල්හා (රලි) තුමා උමර් (රලි) තුමාට මෙසේ පැවසීය. “මරණ අවස්ථාවේ වදනක් පවසා ඔහුගේ මරණය පහසු කර ඔහුගේ වර්ණය ආලෝකමත් කරනු නොලැබූ දාසයෙක් නොමැත.‘ යයි නබි (සල්) තුමාණෝ දිනක් පවසනු ඇසුවෙමි. මට එය කළ නොහැකිවනු ඇතැයි බිය වූ එකම හේතුවෙන් එගැන නබි (සල්) තුමාණන්ගේ මරණය සිදුවීමට පෙර එතුමාණන්ගෙන් මම විමසුවේ නැත.“

එවිට උමර් (රලි) "එය කුමක් දැයි මම දනිමි." යයි කීය "එය (වදන) කුමක් දැ" යි තල්හා (රලි) විමසූ විට, "නබි (සල්) තුමාණෝ තම මහප්පාට පවසන ලෙස ඉල්ලීම් කළ වදනට වඩා උතුම් වදනක් ඔබ දන්නවාද? (එය තමයි) ලා ඉලාහ ඉල්ලල්ලාහ්." යනු උමර් (රලි) පැවසීය. එවිට තල්හා (රලි) "එයයි වදන. අල්ලාහ්ගේ නාමයෙන් කියමි. එයයි වදන." යයි පැවසීය.

## 17. නැමදුමෙහි සරණ පැතීම

*"ඉවසීමෙන් ද සලාත්හී යෙදීමෙන් ද පිහිට ඉල්ලනු."* අල් කුර්ආන් 245

"නබි (සල්) තුමාණෝ යම් හේතුවක් නිසා සිත් වේදනාවට පත්වූ සෑම විටම එතුමාණෝ නැමදුම් කළහ. ගමනක නිරතව සිටි ඉබ්න් අබ්බාස් (රලි) තුමා, තම සොයුරාගේ මරණය ගැන ආරංචි වූ විගස, මාර්ගය අසල බැස අල්ලාහ්ගේ අණට එකඟව නැමදුම් කළේය." යයි හුදෙයිෆා (රලි) වාර්තා කළේය.

## 18. ජිහාද් -සිත් තැවිල්ල ඉවත් කිරීමේ තවත් මාර්ගයකි.

"අති උතුම් හා භාග්‍යවත් අල්ලාහ්ගේ මාර්ගයේ ජිහාද් හී ඔබ වැහැස දැරිය යුතුයි. එය ස්වර්ගයේ දොරටුවක් වන අතර ඒ මගින් අල්ලාහ් සිත් තැවිල්ල හා පීඩාව ඉවත් කරන්නේය." යනුවෙන් නබි (සල්) තුමාණෝ පැවසුහ.

## 19. අල්ලාහ්ගේ ප්‍රකට හා ගුප්ත ආශීර්වාද ගැන සාකච්ඡා කිරීම

අල්ලාහ්ගේ ප්‍රකට හා ගුප්ත ආශීර්වාදයන් පිළිගැනීමෙන් හා ඒවා ගැන කථා කිරීමෙන් කනස්සල්ල හා ශෝකය ඉවත්වෙයි. අල්ලාහ්ට කෘතඥවීමේ චෛතසික ස්වාභාවයේ දාසයා සිටිය යුතුයි. ඔහු දරිද්‍රතාවේ හෝ අසනීපව හෝ වෙනත් ආකාරයේ

දුක්ඛිතකමේ පසු වුවත් ඔහුට ළඟා විය හැකි උච්චතම අදියර එය වේ. අල්ලාහ් ඔහුට දුන් අප්‍රමාණ ආශීර්වාද හා ඔහුට සිදු වු පීඩා ගණන සමාන කළ බැලුවේ නම්, එම පීඩා සුළු ඒවා බව ඔහු අවබෝධ කර ගනී.

තම දාසයා දුක් හා ව්‍යසනයන්ට ලක් කරමින් අල්ලාහ් පරීක්ෂණ කරන අවස්ථාවේ ඒවා ඉවසීමෙන් දරා ගන්නා විට ඒවා ඔහුට පහසු කර දෙනු ලබන අතර, ඒවා සඳහා ත්‍යාග ලබන බවද ඔහු දනී. මේ මගින් ඔහුගේ සියලු කරදර ඔහුට පහසු බවට පත් වන නිසා ඔහු ඒවායේ අපහසු තාවය අමතක කර දමයි.

මේ පිළිබඳව අබු හුරෙයිරා (රලි) දන්වන නබි (සල්) තුමාණන්ගේ උපදෙස් අදාළ වේ.

“ඔබට ඉහළින් සිටින අය දෙස නොබලා ඔබට පහළින් සිටින අය දෙස බලනු. එවිට අල්ලාහ් ඔබට දුන් ආශීර්වාදය ඔබ සුළු කොට සලකන්නේ නැත.“ සහීහ් හදීසයක්.

මෙම හදීසයේ වැදගත් සංකල්පය වටහා ගත් කෙනෙක්, තමාට වඩා පහළ මට්ටමේ සිටින අය දෙස බලා, සෞඛ්‍ය, කායික ශක්තිය, රිස්ක් නම් ආහාර පානාදිය, ඇඳුම් පැලඳුම් සහ නවාතැන් යනාදියෙහි ඔවුන්ට වඩා තමා හොඳ තත්ත්වයේ සිටින බව වටහා ගනී. මේවා දකින විට ඔහුගේ සිත්තැවිල්ල, අසහනය, හා මානසික පීඩාව සියල්ල ඉවත් වී අල්ලාහ්ගෙන් ලැබු ආශීර්වාදය සඳහා සතුටු වෙයි. මානසික අසහනය ඉවත් කිරීමට මෙයද එක් මාර්ගයකි.

## 20. දැනුම සෙවීම වැනි ඵලදායි ක්‍රියාවෙහි නිරතවීම

මෙවැනි කටයුතු වල නිරත වීමෙන් කෙනෙකුගේ අසහන සිතුවිලි වලින් මිදෙන්නට හැකි වනු ඇත. සියලු ප්‍රශ්න අමතක කර, තම ක්‍රියාවේ සිත යොමු කිරීමෙන් සතුටු ලැබිය හැකි වේ. මෙම පියවර දේව විශ්වාසය සහිත අය මෙන් දේව විශ්වාසය රහිත අයද තෝරා ගත හැක. එහෙත්, ඔහුගේ ඊමානය, අව්‍යාජ

සිතුවිලි, අල්ලාහ්ගෙන් ත්‍යාග ලබන අරමුණින් දැනුම සෙවීම හෝ දැනුම බෙදා දීම වැනි ඵලදායි ක්‍රියාවක නිර වීම තුළින් දේව විශ්වාසිකයෙක් වෙන් කර පෙනෙනු ඇත. ඔහු නැමදුමෙහි නිරතවුයේ නම් එය නැමදුමකි. ඔහු මෙවැනි ලෞකික කටයුතුවල සැබෑ අරමුණකින් අල්ලාහ්ගේ සහය පතා නිරත වුයේ නම්, මෙය අවනත වීම සහිත වූ නැමදුමකි. මෙමගින් ඔහුගේ සිත් තැවිල්ල, පීඩාව හා දුක ඉවත් වනු ඇත. මානසික ව්‍යසනය හා දීර්ග කාලීන දොම්නසට ලක්ව නොයෙක් ආබාධයෙන් පසු වන බොහෝ දෙනා අපි දකිමු. තම මානසික පීඩනය අමතක කර, ප්‍රයෝජනවත් ක්‍රියාවන් හි යෙදීම මෙම පිරිසට සුදුසු ප්‍රතිකාරය වේ. ඔවුන් ප්‍රිය කරන ක්‍රියාවන් හි යෙදීම මෙහිදී ඉතා වැදගත් වන අතර ඒ තුළින් ප්‍රතිකාරය සාර්ථක වනු ඇත. සියලු දැනුම අල්ලාහ්ට හිමිය.

## 21. අප්‍රිය කරන දැය වෙත ධනාත්මකව බැලීම

"විශ්වාසීන් කිසිවෙක් විශ්වාසී කාන්තාවකට වෛර නොකළ යුතුයි. ඇගේ ස්වභාවයේ එක් ලක්ෂණයක් ඔහු අප්‍රිය කළත්, ඇගේ තවත් එකකින් ඔහු සතුටු වනු ඇත." යනුවෙන් අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණෝ පැවසූ බව අබූ හුරෙයිරා (රලි) දන්වයි.

අසහනය හා මානසික ව්‍යසනය ඉවත් කර. ශාන්තභාවය ආරක්ෂා කර. ඉස්ලාමයේ අනිවාර්ය හෝ රුකුල් දෙන කර්තව්‍යයන් සියල්ල ඉටුකර දෙපාර්ශවය අතර සාමය ස්ථාපනය කිරීම මෙම හදීසයේ අදහස වේ. කවරෙකු නබි (සල්) වරයාණන්ගේ වදනට එරෙහිව කටයුතු කරන්නේද ඔහු එම විෂයෙහි අයහපත් පැත්ත පමණක් දකින අතර, එහි යහපත් පැත්ත පිළිබඳව ඔහු අන්ධ බවට පත් වනු ඇත. මෙවැනි තැනැත්තා අසහනය හා දොම්නසට පත් ව ඔහුගේ සමීප හිත මිතුරන් සමඟ තිබෙන සම්බන්ධකම අප්‍රසන්න බව පත් වී ඔවුනතර සිදු විය යුතු පොදු වගකීම පවා ඔහු නොසලකා හරින්නට ඉඩ ඇත.

## 22. මෙම කෙටි ජීවිතයේ සැබෑ වටිනාකම පහදා ගැනීම.

තම සැබෑ ජීවිතය සතුට හා සන්තුෂ්ටිය පිරුණු එකක් බව බුද්ධිමත් කෙනෙක් දනී. ජීවිතය කෙටි එකක් බැවින්, ව්‍යසනය හා දොම්නසට පත්වීමෙන් එම ජීවිතය තවත් කෙටි වනු ඇත. ජීවිතයේ අරමුණට මෙය එරෙහි වන හෙයින් තම ජීවිතයේ වැඩි කොටසක් ව්‍යසනය හා දොම්නස යටතේ ගෙවීමට ඔහු පසුබට වෙයි. මෙම ස්ථාවරයෙහි දේව විශ්වාසය සහිත කෙනෙක් හා කැරලි කරුවෙක් අතර කිසිදු වෙනසක් නොමැත. එහෙත් දේව විශ්වාසය සහිත කෙනෙකුට එම අරමුණ මෙලොව හා මරණයෙන් පසු ජීවිතයේ අලංකාරවත් ප්‍රතිඵලය ගෙන දෙන අයුරින් ඉෂ්ට කර ගන්නට හැකි වනු ඇත. ඔහුට යම් අවාසියක් සිදු වන විට හෝ අයහපතක් සිදුවේ යයි බිය වන විට, තමා ලැබූ අල්ලාහ්ගේ ධාර්මික හා ලෞකික ආශීර්වාද සියල්ල සිහි කර ගත්තේ නම්, දැන් හට ගන්නා අවාසිය හෝ අයහපත ඉතාමත් අල්ප බව දැනේ. එමෙන්ම, තමාට හානි සිදුවිය හැක යයි ඔහු සැක කරන දේ සමඟ තමා එවැනි හානියෙන් ආරක්ෂා ලැබීමේ අවස්ථාව සසඳා බැලිය හැක. තමාට හානි සිදු වීමේ අවස්ථාවට වඩා, හානි සිදු නොවීමේ අවස්ථා අධික බව දැන ගත් විගස ඔහුගේ සිතෙහි සහනය හා සාමය හට ගනී. එමගින්, සිදු විය හැක යැයි සිතූ හානියට මුහුණ දෙන්නට ඔහු සූදානම්ව සිටියි.

## 23. වැඩ කොටස ගොඩ ගැසීමට ඉඩ නොතැබීම

තීරණාත්මක පියවර ගැනීමෙන් ඉදිරි අනාගතයේදී පැන නැගිය හැකි ඕනෑම දැයකට සූදානම් ව සිටීම මෙහි අර්ථය වේ. අවසන් නොකළ වැඩ කොටස ගොඩ ගැසීමෙන් යම් ප්‍රශ්නයක් පැන නැගුනේ නම්, ඒවා පිළිබඳව නිසි ලෙස ක්‍රියා කිරීමට නොහැකි වෙයි. සියලු කටයුතු නියමිත වේලාවට අවසන් කළහොත්, ඉදිරියට පැමිණෙන ප්‍රශ්න සඳහා නිදහසේ පියවර ගත හැකි වන අතර ඒ සඳහා අවශ්‍ය මානසික ශක්තිය ද ඉතිරි වෙයි.

තම ජීවිතයේ වැදගත් විෂයයන්ට ප්‍රමුඛතාව දිය යුතු අතර, තමා කැමති විෂයයන් ගැනද සැලකිලි දැක් විය යුතුය. එසේ නොකළේ නම් ඔහුගේ ජීවිතයේ කිසිදු ආස්වාදයක් ඔහු නොලබයි. පැහැදිලි සිතුවිලි සහ අන් අයගෙන් අදහස් විමසා තම ක්‍රියා මාර්ගය වර්ධනය කළ හැක. සුදුසු අයගෙන් අදහස් විමසීම ලැජ්ජාවට හේතුවක් නොවේ. තමන් ගත යුතු පියවර ගැන දීර්ඝව කල්පනා කර, නිසි මාර්ගය තෝරා ගෙන, අල්ලාහ් කෙරෙහි ස්ථිර විශ්වාසයෙන් පා තැබිය යුතුයි. තමා වෙත විශ්වාසය තබන්නන්ට අල්ලාහ් බොහෝ කැමතිය.

## 24. ඕනෑම දැයකට සූදානම්ව සිටීම

තමා ආදරය කරන කෙනෙකුගේ විපත, ඥාතියෙකුගේ අසනීපය, යම් පාඩුවක් සිදුවීම, සතුරෙකුට පරාජයවීම, හෝ මෙවැනි තවත් ඕනෑම අප්‍රසන්න දෙයකට කෙනෙක් සූදානම් ව සිටීමද එම අවස්ථාවෙහි අල්ලාහ්ගේ රැකවරණය අපේක්ෂා කිරීමද කෙනෙකුට බලවත් ශක්තියක් ගෙන දෙයි. මෙවැනි අයහපතක් සැබැවින්ම සිදුවුයේ නම්, එම ගැටුම නිසා ඔහුට බලවත් හානියක් සිදු නොවීමට හේතුව, එවැනි දෙයකට ඔහු සූදානම්ව සිටීම සහ අවශ්‍ය පියවර තීරණය කර අවසන් නිසාය.

මෙහිදී වැදගත් කරුණක් වන්නේ, මහා අපේක්ෂා සහිත වූ ජනයා, බලවත් ව්‍යසනයන්ට සන්සුන්ව හා ඉවසීමෙන් මුහුණ දෙන්නට සූදානම්ව සිටින නමුත්, සුළු විෂයන් පිළිබඳව ඔවුන් කලබලවීමට හා සිත්තැවිල්ලට පත් වනු ඇත. මහා ව්‍යසනයට සූදානම් වන මේ පිරිස සුළු ප්‍රශ්නයන්ට මුහුණු දිය නොහැකි වීමෙන් ඔවුන්ගේ ජීවිතයට එයින් හානි සිදු වනු ඇත. එහෙත් ඥානාන්විත පුද්ගලයෙක් මහා ව්‍යසනයට මෙන් සුළු ප්‍රශ්නයන්ටද සූදානම්ව, ඇස් පිය හෙළන මොහොතක පවා තම කටයුතු තමා භාරව නොතබන ලෙස අල්ලාහ්ගෙන් සහය පතයි. එමගින් සියලු අවස්ථාවන්හීම ඔහු සන්සුන්ව සිටින්නට පුරුදු වෙයි.

## 25. ආගමික විද්වතුන්ගෙන් උපදෙස් පැතීම

ව්‍යසනයක් හෝ පිඩාවක් සිදු වූ විට ආගමික විද්වතුන්ගෙන් උපදෙස් පැතීම තුළින් අචලව හා සන්සුන්ව කටයුතු කිරීමට හැකි වනු ඇත. උතුම් සහාබාවරු සතුරන්ගෙන් වද වේදනාවට ලක් වූ අවස්ථාවන්හී, අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණන්ට පැමිණිලි කළහ.

කබ්බාබ් ඉබ්න් අල් අරාත් (රලි) මෙසේ දැන්විය. කඅබාවේ සෙවණේ අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණෝ තම ලෝගු මත හාන්සි වී සිටින විට "අපට ජයග්‍රහණය දෙන ලෙස අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා නොකරන්නේ ඇයි? අපි වෙනුවෙන් අල්ලාහ්ගෙන් දුආ නොකරන්නේ ඇයි?" දැයි ඇසුවෙමි.

එවිට එතුමාණෝ, "ඔබට පෙර වූ ජනතාවගෙන් කෙනෙක් වළක් තුළ දමනු ලබයි. පසුව ඔහුගේ හිස කියතකින් දෙකට කපති. එහෙත් එයින් ඔහුගේ දේව විශ්වාසය ඉවත් කිරීමට ඔවුන්ට නොහැකි වෙයි. යකඩ පනාවක් මගින් ඔහුගේ සිරුරේ අස්ථියෙන් මස් හා නහර (වෙන් කරනු පිණිස) පීරති. එහෙත් එයින් ඔහුගේ දේව විශ්වාසය ඉවත් කිරීමට ඔවුන්ට නොහැකි වෙයි. අල්ලාහ්ගේ නාමයෙන් (පවසමි) මෙම විෂය සම්පූර්ණ කරනු ලබන්නේමයි. (ඉස්ලාමය පරිපූර්ණ වී පැතිර පවති) එවිට සනආ සිට හද්රමව්ත් දක්වා කෙනෙක් අල්ලාහ් හැර අන් කිසිවෙකුට බියෙන් තොරව ගමනේ යෙදෙයි. ඔහුගේ බැටළුවන් ද වෘකයා විසින් පහර දෙනු ලැබීමේ බියෙන් තොරව (සිටින තුරු). එහෙත් ඔබ ඉතාමත් නොඉවසන සුළුය." යි පැවසීය.

තාබිඊන් වරුන්ද, මෙලෙස සු□බෙයිර් ඉබ්න් ආදයි (රලි) යන සහාබි වරයාට පැමැණිලි කළහ. එවිට එතුමා මෙසේ පැවසීය, "අපි අනස් (රලි) වෙත පැමිණ අල් හජ්ජාජ්ගෙන් අපට සිදුවන උවදුරු ගෙන පැමැණිලි කළෙමු. එවිට අනස් (රලි) 'ඉවසීමෙන් සිටිනු. මෙය (උවදුරු) වඩාත් නරක බවට පත්වීමෙන් පසු පැමිණෙන වේලාව හැර වෙනත් වේලාවක් ඔබේ පරමාධිපතියා හමු වන තුරු පැමිණෙන්නේ නැත.'

යනුවෙන් නබි (සල්) තුමාණෝ පවසනු සවන් දුන්නෙමි.' යයි කීය."

මේ අයුරින් මුස්ලිම්වරු, තම ආගමික නායකයින් සහ විද්වතුන් ගේ යහ වදනට සවන් දී අසහනය සහ කනස්සල්ල සැහැල්ලු කර ගනිති.

කෙනෙක් තම අවංක සොයුරන්, ඥානවත් ඥාතීන්, විශ්වාසවන්ත බිරිය හෝ සැමියාගෙන් සහාය හෝ උපදෙස් පැතිය හැක. ෆාතිමා (රලි) තුමිය අසහනයට පත් වූ විට සැමියා අලි (රලි) ට පැමිණිලි කළාය. අබ්දුල්ලාහ් ඉබ්න් උමර් (රලි) සහ එතුමාගේ පියාණන් මෙසේ දැන්වූහ. "දිනක් රසූල් (සල්) තුමාණෝ තම දුව ෆාතිමා (රලි) දැක ගන්නට පැමිණීය. එතුමියගේ දොරේ තිරයක් දමා තිබෙණු දැක, ඇතුල් නොවී හැරී ගියහ. දුවගේ නිවස වුවත්, සලාම් නොකියා එතුමාණෝ කිසි විටක ඇතුළු නොවෙයි. අලි (රලි) තුමා නිවසට පැමිණි විගස, "නබි (සල්) තුමාණෝ මා වෙතට පැමිණි නමුත් ගේ තුළට පැමිණියේ නැත." යැයි කීවාය. අලි (රලි) වහාම ගොස්, "අල්ලාහ්ගේ රසූල් (සල්) තුමණි, ඔබ තුමාණන් නිවසට ආ නමුත් නිවස තුළට නොපැමිණි හේතුවෙන් ෆාතිමා (රලි) සිත අවුල් වී සිටියි." යනුවෙන් කීය.

එවිට එතුමාණෝ, "ලෞකික දේ හා අලංකාර සැරසිලි වලින් මට වැඩක් නැත." යයි කීහ. රසූල් (සල්) තුමාණෝ පැවසු දේ අලි (රලි) නිවසට ගොස් ෆාතිමා (රලි) තුමිය වෙතට කීය. "මෙයට මම කුමක් කළ යුතු දැයි අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණන්ගෙන් අසන්න." යැයි ෆාතිමා (රලි) තුමිය කීය. එවිට එතුමාණෝ "එය අසවල් ගෝත්‍රයට යවන ලෙස කියන්න." යනුවෙන් කිහ. (එය සැරසිලි සහිත මැහුම් දැමු තිරයකි.)

## 26. ඥාණවත් හා යහපත් අය සමඟ කථා කිරීම

වලීද් (රලි) ගේ නිදහස ලැබූ වහලා වන අල් මුගීරා (රලි) මෙසේ දන්වයි. “දිනක් අල් වලීද් (රලි) වෙතට ගිය විට, එතුමා මහත් කනස්සල්ලෙන් සිටිනු දුටුවෙමි. අමීර් අල් මූමිනීන් තුමනි! ඔබේ කනස්සල්ල කුමක්ද?“ යැයි විමසුවෙමි. මුස්ලිම්වරුන්ගේ සංඛ්‍යාව අධිකවී ඇත. මස්ජිදය ඔවුන්ට (ඉඩ පහසුකම් නොමැතිව) කුඩාවී ඇත. මෙම (ක්‍රිස්තු) දෙව් මැදුරේ ඉතිරි කොටස මිලට ගෙන එමගින් මස්ජිදය විස්තීරණය කර මුස්ලිම්වරුන්ට ඉඩ සලසනු පිණිස මම මුදල් දුන් නමුත් ඔවුන් එය ප්‍රතික්ෂේප කරති.“ යැයි පැවසුහ. “අමීර් අල් මූමිනීන් තුමනි, ඔබේ ප්‍රශ්නය විසඳන්නට මා වෙත අදහසක් තිබේ.“ යයි මම කී විට “එය කුමක් දැ?යි“ එතුමා විමසුහ. “සහාබාවරු ඩමස්කස් නුවර අත්පත් කර ගත් අවස්ථාවේ, කාලිද් ඉබ්න් අල් වලීද් (රලි) නගරයේ නැගෙන හිර දොරටුව ආයුධ මගින් ජය ගෙන ඇතුළු විය. මේ බව ආරංචි වූ විගස නගරයේ තවත් දොරටුව වටලා ගෙන සිටි අබූ උබෙයිදා (රලි) වෙත ජනතාව දිව ගොස් ඔහුගෙන් රැකවරණය පැතුවෝය. ඔහු ඔවුන්ට රැකවරණය දීමට එකඟ වූ විට, ඔවුන් ජාබියා දොරටුව ඔහුගේ සේනාවට විවෘත කර දීමෙන් අබූ උබෙයිදා (රලි) ඔවුන් හා ගිවිසුමක් අත්සන් කර, සාමයෙන් නගරයට ඇතුළු විය. අපේ හමුදාව ශක්තාය යොදා අල්ලා ගත් ඉඩම් ප්‍රමාණය කොපමණ දැයි සොයා බලා, එය අත්පත් කර ගත යුතුයි. එහෙත් ඔවුන් ගිවිසුමකින් දුන් ඉඩම් ඔවුන්ටම භාරදිය යුතුයි. දේව ස්ථානයේ විශාල කොටසක් හමුදා විසින් අත්පත් කර ගත් ඉඩමට අයත් යයි සිතමි. එනිසා ඒ කොටස මස්ජිදයට එකතු කළ හැක.“ යනුවෙන් පැවසුවෙමි.

එයට සවන් දුන් අල් වලිද් (රලි) “ඔබ මගේ සිතට සහනය දුන්නේය. ඔබම මේ කටයුතු අවසන් කරන්න.“ යනුවෙන් පැවසුහ. මේ කටයුතු භාර ගත් අල් මුගීරා (රලි) නැගෙන හිර දොරටුව සිට ජාබියා දොරටුව දෙසට රයිහාන් වෙළඳ පොල දක්වා මැන බලා, දේව ස්ථානයේ විශාල ප්‍රමාණයක් පසු කර ගෙන තවත් විශාල ඉඩම් ප්‍රමාණයක් හමුදාව අත්පත් කර

ගෙන තිබෙන බව දුටුවේය. එනිසා දේව ස්ථානය මස්ජිදයට සම්පූර්ණව ඇතුළත් කර ගත හැකි බවද දැන ගත්තේය. මේ තොරතුරු දැන ගත් අල් වලීද් (රලි), 'සම්පූර්ණ දේව් මැදුර අත්පත් කර ගත් ඉඩමේ මායිම තුළ තිබෙන බවද ඒ ඉඩම් කොටස අපට අයත් ය' යනුවෙන් ඒ රටේ ක්‍රිස්තු බැතිමතුන්ට දන්වා පණිවුඩයක් එව්ය.

එවිට ඔවුන් (ක්‍රිස්තු බැතිමතුන්), "ආරම්භයේ අපට මුදල් සහ ඉඩම් දෙන්නට ඔබ ඉදිරිපත් වුණෝය. අපට ගෙවන්නට මුලින් පොරොන්දු වූ මුදල් ප්‍රමාණය දීමට නිර්ලෝභීවන්න. අපගේ දේව ස්ථානයේ ඉතිරි කොටසද අපි දෙන්නට කැමති අතර මෙම විෂය සාමයෙන් විසඳා ගනිමු." යැයි පැවසුවෝය. මෙමගින් එම ප්‍රශ්නය සාමකාමීව විසඳනු ලැබුණි. (බදායා ව අල් නිහායා ෆි සිරත් අල් වලීද්)

27. සෑම ව්‍යසනයෙන් පසුව පහසුව ඇත.

ව්‍යසනයට ලක් වූ කෙනෙක් අල්ලාහ් තමාට මාර්ගයක් විවෘත කර දෙන බව විශ්වාසය සහිතව ඵලදායක ලෙස කල්පනා කළ යුතුයි. කෙතරම් බරපතළ ව්‍යසනයට හා සිත් තැවුලට ඔහු ලක්වන්නේද, එයට වඩා සීඝ්‍රව තමා එයින් සහනය ලබන බව ඔහු දැන සිටිය යුතුයි.

"සැබැවින්ම, දුෂ්කරකම සමඟ සහනය ඇත්තේය. සැබැවින්ම, දුෂ්කර කම සමඟ සුලබ බව ඇත්තේය." අල් කුර්ආන් 94: 5 හා 6.

සැබැවින්ම, දුෂ්කරතාව එක් වරක් ද සහනය දෙවරක් ද මෙහි සඳහන් වී ඇත. එයට හේතුව අල් යන වදන එකතුවීමෙන් ප්‍රථම වාක්‍යයෙහි සඳහන් දුෂ්කරතාව දෙවන වාක්‍යයෙහිද සඳහන් වන නමුත්, ඒවායෙහි සඳහන් සහනය සීමා නොවන එකක් වේ. එම නිසා පළමු වාක්‍යයෙහි සඳහන් සහනය දෙවන වාක්‍යයෙහි සඳහන්වන සහනයෙන් වෙනස් වූ එකකි.

“ඉවසීම තුළින් විජයග්‍රහණය (යමක් ඉටු කර ගැනීම) ද අපහසුතාව තුළින් පහසුතාව ද ලැබෙන බව දැන ගනු“ යනුවෙන් ඉබ්න් අබ්බාස් (රලි)ට සහ එතුමාගේ පියාට රසූල් (සල්) තුමාණෝ පැවසුහ.

## 28. ආහාර මගින් අසහනයට ප්‍රතිකාර

අසනීපය හෝ ව්‍යසනයට ලක්වූ අයට “තල්බීන්“ දෙන ලෙස අයිෂා (රලි) තුමිය පැවසුවාය. “අසනීපයෙන් පසු වන අයගේ හදවත් තල්බීන් උණුසුම් කරන අතර, මිනිසාගේ ඇතැම් ශෝකය සැහැල්ලු කරයි යනුවෙන් අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණෝ පවසනු සවන් දුන්නෙමි.“ යැයි එතුමිය දන්වා බුහාරි වාර්තා කර ඇත.

පවුලේ සාමාජිකයෙක් මරණයට පත් වූ විට, නිවසට පැමිණි කාන්තාවන් (ඥාතීන්) විසිරී ගිය පසු, පවුලේ සමීප ඥාතීන් සහ මිතුරන් පමණක් නිවසේ ඉතිරි වී සිටින විට, තල්බීන් හට්ටියක් ඉල්ලා එය පිසා, තරීද් (පොඟවන ලද රොටි, මස් සහ හොදි) සූදානම් කර, එය මත තල්බීන් වත් කර, එහි සිටින කාන්තාවන් අමතා, “මෙය අනුභව කරන්න. මන්ද, අසනීපයෙන් පසුවන අයගේ තාපය තල්බීන් සුව කරන අතර, මිනිසාගේ ඇතැම් ශෝකය සැහැල්ලු කරයි යනුවෙන් අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණෝ පවසනු සවන් දුන්නෙමි.“ යනුවෙන් පවසයි. බුහාරි වාර්තා කරයි.

තල්බීන් යනු තිරිඟු පිටි හෝ නිවුඩු යොදා සාදා ගත් සූප් හෝ හොද්දක් ය. එයට මීපැණි වත් කරනු ලබයි. එය කිරි මෙන් සුදු පැහැති නිසා තල්බීන් යනුවෙන් හැඳින් වේ. එය බාර්ලි පිටිවලින්ද සාදන ලදී.

එය අසනීපයෙන් සිටින කෙනෙක් ලිහිල් කර, රෝගියාට යළි ශක්තිය සපයා ඔහුගේ දුක හා අසහනය සැහැල්ලු කරයි.

කවරෙකු හෝ අසනීපයෙන් හෝ රුදාවෙන් හෝ කෑම නොගෙන සිටින බව නබි (සල්) තුමාණන්ට ආරංචි වුවහොත් මෙසේ පවසන බව ආයිෂා (රලි) තුමිය දන්වා ඉමාම් අහමද් (රහි) වාර්තා කරයි.

"ඔබ තල්බීන් සූදානම් කළ යුතුයි. ඔහු ටික ටික එය පානය කළ යුතුයි. මාගේ ප්‍රාණය කාගේ අතේ තිබේද, (ඔහු මත දිවුරා කියමි) ඔබ ජලයෙන් මුහුණ සෝදා එහි අපිරිසිදු ඉවත් කරන්නා මෙන් එය ඔබ අතර ඕනෑම කෙනෙකුගේ ආමාශය පිරිසිදු කරයි."

රසූල් (සල්) තුමාණන්ගේ පවුලේ කිසිවෙක් අසනීප වුවහොත්, ඒ අයට සුප් හෝ හොද්දක් සූදානම් කරන ලෙස උපදෙස් දෙයි. එයින් ටික ටික පානය කරයි. ජලය කෙනෙකුගේ මුහුණේ අපිරිසිදු ඉවත් කරන්නා සේ, මෙය ශෝකයට ලක් වූ හදවත ශක්තිමත් කර රෝගියාගේ හදවත පිරිසිදු කරයි. යනුවෙන් පැවසූ බව ආයිෂා (රලි) තුමිය දන්වා අත් තිර්මිදි වාර්තා කරයි.

ඇතැම් අය මෙම හදීසය පුදුම දෙයක් ලෙස දුටුවත්, මෙය සැබෑවක් වන අතර, අල්ලාහ්ගෙන් පහළ වී සනාථ වූ දෙයක් ය. අති උතුම් අල්ලාහ් සියලු වර්ගයේ ආහාර උපද වූ අතර, ඒවායේ ස්වභාවිකය ගැන හොඳ හැටි දනී. එනිසා හදීසයේ සඳහන් පරිදි බාර්ලිවලින් පිසින ලද සුප් කෙනෙකුට සහනය දෙන බව අල්ලාහ් දනී.

මෙය පිසීමේ ක්‍රමය පිළබඳව ඉබ්න් හජර් (රහි) මෙසේ දැන්විය. "බාර්ලි බීජය තම්බා ගත් ජලය ශාරීරික රෝගියෙකුට සුදුසු වන අතර, අඹරා පිටි කරන ලද බාර්ලියෙන් පිසින ලද සුප්, දුකට පත් වූ කෙනෙකුට සුදුසුය."

## 29. ඉමාම් ඉබ්න් අල් කය්යිම් ගෙන් උපදෙස්.

ඉහත සාකච්ඡාවෙන් අනතුරුව, මෙම මාතෘතාව සම්බන්ධව ඉමාම් ඉබ්න් අල් කය්යිම් (රහි) විසින් ලියන ලද තොරතුරු දෙස බලමු. එතුමා ව්‍යසනය හා දුක සුව කළ හැකි ප්‍රතිකාර ක්‍රම 15ක් සඳහන් කර ඇත. ඒවා නම් තව්හිද් අල් උලූහියය්‍යා, තව්හීද් අල් රුබූබිය්‍යා. තව්හීද් අල් අස්මා අල් හුස්නා යනුවේන්ය.

-  අල්ලාහ්ගේ දාසයාගෙන් කිසිදු වරදකින් තොරව ඔහුට නරක ලෙස සැලකිලි දක්වන්නට හෝ දඬුවම් දීමෙන් අල්ලාහ් ඉතා උසස් බව ප්‍රකාශ කිරීම.
-  දාසයා තමා වැරදි කළ බව පිළි ගැනීම.
-  අල්ලාහ්ගේ උතුම් දෙයින්, එනම් අල්ලාහ්ගේ අලංකාරවත් නාමයන් ගෙන් අල්ලාහ් ගෙන් යදීම.
-  ඒවා අතර අල් හය්යු සහ අල් කයියූම් යනු ඉතා උතුම් නාමයන්ය.

## 30. අල්ලාහ්ගෙන් පමණක් සහය පැතීම

අල්ලාහ් කෙරෙහි සියලු විශ්වාසය තබා, සියලු කරුණු ඔහුට භාර කිරීම, ඔහුගේ අතෙහි තම කෙස් රොද තිබෙන බවද, සියලු කටයුතු ඔහු කැමති ආකාරයට ඔහු පාලනය කරන බවද, ඔහුගේ අණ සාධාරණ බවද එය අනිවාර්යයෙන් ඉටු වන බවද පිළිගැනීම.

අල් කුර්ආනය කියවීම, එහි අර්ථය පිළිබඳව ඕනෑ කමින් සිතා බැලීම, සෑම ව්‍යසනයන්ට එහි සැනසිලි සෙවීම, හදවතේ සියලු රෝගයන්ට එහි ප්‍රතිකාරයක් (ආධ්‍යාත්මික හා මානසික) සෙවීම යන ඒවා මගින් දුක, පීඩාව, ව්‍යසනය හා අසහනය යන සියල්ල ඉවත් කරනු ලැබේ. අල්ලාහ් ගෙන් අවංකව ක්ෂමාව අයැදීම, පසුතැවිලිවීම, අල්ලාහ්ගේ මාර්ගයේ වෙහෙස

(ජිහාද්) දැරීම සහ සලාතයේ නිරතවීම, සියලු ශක්තිය හා බලය අල්ලාහ් වෙත තිබෙන බවද ඒවා ඔහුට හිමි බවද පිළි ගැනීම.

31. දුආ (ප්‍රාර්ථනාව)

- ව්‍යසනයෙන් අපව ආරක්ෂාව සහිතව තබන ලෙසද,
- දොම්නසින් සහන දෙන ලෙසද
- අපේ කනස්සල්ල ඉවත් කරන ලෙසද අති උතුම් අල්ලාහ් ගෙන් දුආ කරමු.

මන්ද, සියල්ලට සවන් දෙන්නේ හා ප්‍රාර්ථනාවන්ට පිළිතුරු දෙන්නේ ඔහුමය. සදා ජීවමාන හා සදා කාලීන ඔහුමය.

# මතක් කිරීමක්

අවසානයේ මෙලොවේ පීඩාව කෙතරම් විශාල වුවද කෙතරම් අප්‍රමාණ වුවද මරණයෙන් පසු ජීවිතයේ ව්‍යසනය හා දුක මෙයට වඩා අධිත බව අපි මතකයේ තබා ගත යුතුයි. අවසාන විනිශ්චය සඳහා සෑම කෙනෙක්ම රැස්තරනු ලබන විට පැන නගින ව්‍යසනය මෙය වේ.

අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණෝ මෙසේ පැවසූ බව අබු හුරෙයිරා දන්වා බුහාරි වාර්තා කරයි.

පුනරුත්ථානය සිදු වන දිනයේ මම සියලු ජනතාවගේ නායකයා වන්නෙමි. මම සියලු ජනයාගේ නායකයා වන්නේ කුමක් නිසාදැයි ඔබ දන්නවාද? පළමු මිනිසා සිට අවසාන මිනිසා දක්වා සියලු ජනයා අල්ලාහ් එක් ස්ථානයක රැස් කරයි. එය කෙසේද යත්, අමතන්නාගේ ඇමතුම ඔවුන් සියලු දෙනාටම ඇසෙන අතර, ඔවුන් සියලු දෙනාම එක වරට පෙනී සිටිති. ඉර ඔවුන්ට ඉතා සමීපයට ගෙනෙනු ලබයි. එවිට ඔවුන් ඉවසිය නොහැකි තරමට ව්‍යසනයට ලක්වෙති. "ඔබට කුමක් සිදු වූයේ දැයි මිනිසුන් අසති. පරමාධිපති හා මැදිහත් විය හැකි කෙනෙක් කවරෙක්දැ?"යි ඔවුන් පවසති. ඔවුන්ගෙන් ඇතැමුන් "අපි ආදම් (අලෛ) වෙත යමු. . . ." යනුවෙන් පවසති.

කෙනෙක් අද අල්ලාහ් වෙත හැරීම මිස, එදා දින සිදු වන ව්‍යසනය හා වේදනාවට කිසිඳු පිළිසරණයක් නැත.

රසූල් (සල්) තුමාණන්, එතුමාණන්ගේ පවුලේ සාමාජිකයන්, මිනිසුන් අතරින් අති උතුම් සහාබාවරුන් සියලු දෙනාට අල්ලාහ්ගේ ආශිර්වාදය හිමිවේවා. සුළු නින්ද හෝ තද නින්දට පත් නොවන අල්ලාහ්ට සියලු ප්‍රශංසා හිමිවේවා.

මුහම්මද් සාලිහ් අල් මුනජ්ජිද්
තැපැල් අංක 2999,
අල් කොබාර්,
සවුදි අරාබියාව